ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

இலங்கை அரச மருந்தகக் கூட்டுத்தாபனம்

**State Pharmaceuticals Corporation of Sri Lanka**

# 2021

## වාර්ෂික වාර්තාව

## ஆண்டு அறிக்கை

## Annual Report

# වාර්ෂික වාර්තාව
# 2021

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# අන්තර්ගතය


- අපගේ දර්ශනය, මෙහෙවර, පරමාර්ථ සහ පාඨ්‍ය 01
- ප්‍රතිඵල සාරාංශය 02
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු 03-04
- කළමනාකාර මණ්ඩලය 05-07
- සභාපතිතුමාගේ ප්‍රකාශය 08
- මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය 09-10
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 11-12
- විගණන කමිටු වාර්තාව 13
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 14
- ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 15
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 16
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 17
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 18-30
- ගිණුම් සඳහා සටහන් 31-63
- විගණකාධිපතිගේ වාර්තාව 64-80
- මානව සම්පත් විශ්ලේෂණය 81
- ආදායම් වාර්තාව සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 82
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සම්බන්ධ වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු 83
- විකුණුම් ජාලය 84


**ඔබේ සුවසෙත අපේ පැතුමයි**

## අපගේ දර්ශනය

නීරෝගීමත් ජාතියක් ගොඩනැංවීමේ ප්‍රධාන සහකරු බවට පත්වීම

## අපගේ මෙහෙවර

ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ භාවිතය ප්‍රවර්ධනය කරමින්, උසස්, තත්ත්වය සහතික කල
ආරක්ෂාකාරි හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවා සපයන ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම.

## අපගේ පරමාර්ථ

ජනතා සේවයට ප්‍රමුඛතාවය

ගුණාත්මක බව හා ආරක්ෂාව

අසමසම අවංක භාවය

විශ්වාසදායක හවුල්කරුවෙකු සහ ක්‍රියාකාරි සාමාජිකයෙකු වීම

විශිෂ්ඨ කාර්‍යසාධනය සඳහා බැඳීම

අවශ්‍යතා හඳුනා ගැනීම

## අපගේ පාඨය

ඔබේ සුවසෙත අපේ පැතුමයි

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## ප්‍රතිඵල සාරාංශය

| විස්තරය | 2021 රු: ' 000 ' | 2020 රු: ' 000 ' | විචලනය (%) | 2019 රු: ' 000 ' |
|---|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ සංස්ථාවේ විකුණුම් | 9,446,822 | 8,798,047 | 7.4 | 8,924,850 |
| රජයේ බෙහෙත් ගබඩාවට කල සැපයුම් | 70,811,344 | 54,323,565 | 30.4 | 42,959,659 |
| **මුළු ආදායම** | **80,258,166** | **63,121,612** | 27.1 | **51,884,510** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.සං | 2,224,536 | 2,249,676 | (1.1) | 2,279,155 |
| දළ අතිරික්තය - ර.බෙ.ග. | 4,542,116 | 3,415,073 | 33.0 | 2,717,507 |
| **දළ අතිරික්තය** | **6,766,652** | **5,664,749** | 19.5 | **4,996,662** |
| වෙනත් ආදායම් | 88,531 | 287,363 | (69.2) | 91,441 |
| පරිපාලන වියදම් | (1,967,159) | (1,753,834) | (12.2) | (1,619,555) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (1,158,051) | (962,078) | (20.4) | (971,096) |
| මූල්‍ය පිරිවැය | (10,555) | (10,588) | 0.3 | (10,763) |
| බැංකු අයිරා පොළී | (569,624) | (686,878) | 17.1 | (317,470) |
| මූල්‍ය ආදායම් | 6,943 | 6,890 | (0.8) | 6,875 |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **3,156,737** | **2,545,624** | (24.0) | **2,176,094** |
| විශ්‍රාමික පාරිතෝෂික | 57,438 | (191,755) | 130.0 | (1,926) |
| බදු ගෙවීම් | (772,172) | (576,401) | (34.0) | (512,224) |
| **එකතු විස්තීරණ ආදායම** | **2,442,003** | **1,777,468** | (37.4) | **1,661,944** |
| රඳවාගත් ලාභ | 14,650,681 | 12,208,679 | 20.0 | 10,431,211 |
| දායක ප්‍රාග්ධනය හා සංචිත | 125,117 | 125,117 | - | 125,117 |
| ජංගම නොවන වත්කම් | 2,351,604 | 2,329,488 | 0.9 | 2,277,480 |
| ජංගම වත්කම් | 56,585,320 | 39,087,956 | 44.8 | 31,550,527 |
| ජංගම නොවන වගකීම් | 9,904,471 | 11,908,162 | 16.8 | 294,459 |
| ජංගම වගකීම් | 34,256,654 | 17,175,486 | (99.5) | 22,977,220 |
| ශුද්ධ ජංගම වත්කම් | 22,328,666 | 21,912,470 | 1.9 | 8,573,307 |
| **මූලික අනුපාත** | | | | |
| දළ ලාභ අනුපාතය (%) රා.ඖ.සං | 23.5 | 25.6 | | 25.5 |
| දළ ලාභ අනුපාතය (%) ර.බෙ.ග. | 6.4 | 6.3 | | 6.3 |
| දළ අතිරික්තයට විකුණුම් අනුපාතය (%) | 8.4 | 9.0 | | 9.6 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ (%) | 10.5 | 7.7 | | 23.0 |
| පොළී ආවරණය (වාර) | 6.5 | 4.7 | | 7.9 |
| ස්කන්ධයට මුළු වත්කම් (වාර) | 1:4.02 | 1:3.3 | | 1:3.2 |
| යෙදවූ ප්‍රාග්ධනයට විකුණුම් (වාර) | 3.25:1 | 2.6:1 | | 4.8:1 |
| ජංගම අනුපාතය (වාර) | 1:1.6 | 1:2.7 | | 1:1.3 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 1:1.6 | 1:2.1 | | 1:1.2 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | 2.75 | 2.32 | | 2.35 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 948 | 956 | | 971 |
| සේවකයෙකුගේ ඉපයීම (රු.) | 3,329 | 2,663 | | 2,241 |
| සේවකයෙකුට විකුණුම් (රු.) | 84,660 | 66,027 | | 53,434 |

# අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික තොරතුරු
# අධ්‍යක්ෂ මණ්ඩලය

**වෛද්‍ය ඩී.එස්. සමරසිංහ මහතා - වැඩබලන සභාපති**

වෛද්‍ය ඩී.එස්. සමරසිංහ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් MBBS උපාධියත් ශ්‍රී ලංකා විවෘ ත විශ්වවිද්‍යාලයෙන් **L.L.B. (**නීතිවේදී) උපාධියත් ලබාගෙන ඇත. 2010 වසරේ ශ්‍රීලංකා රජයේ වෛද්‍ය සේවයට බැඳුණු ඔහු කරවනැල්ල මූලික රෝහල, මාවනැල්ල මූලික රෝහල හා මහනුවර ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස සේවයකර ඇත.
ඔහු 2020 දෙසැම්බර් මසදී ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ වූ අතර පයේෂණ සහ ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානියා ලෙස සේවය කරන ලදී. ඔහු 2021 වසරේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් විය. වෛද්‍ය සමරසිංහ මහතා 2021 නොවැම්බර් 15වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඔහු 2021 දෙසැම්බර් මස සිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වැඩබලන සභාපතිවරයා ලෙස කටයුතු කරයි.

**වෛද්‍ය ඒ.කේ.එස්.බී.ද අල්විස් මහතා**

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා 2018 ජූලි මස සිට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් -වෛද්‍ය සේවා ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, උපායමාර්ගික සැලසුම්කරණ හා තාක්ෂණික උපදේශක වරයෙකු වශයෙන් කටයුතු කරයි. ඔහුගේ ප්‍රථම උපාධිය 1987 දී යුක්‍රේනයේ Lvov ( පෙරදී සෝවියට් සංගමය) රාජ්‍ය වෛද්‍ය ආයතනයෙන් ලබාගෙන ඇත. වෛද්‍ය නිලධාරී වරයෙකු ලෙස ශ්‍රී ලංකා රජයේ වෛද්‍ය සේවයට සම්බන්ධවූ වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 1996 දීත් වෛද්‍ය පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය 2006 දීත් කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ලබාගෙන ඇත.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා රත්නපුර ප්‍රාදේශීය මහ රෝහලේ රෝහල් අධ්‍යක්ෂක ලෙසත්, පසුව ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂක ලෙස වයඹ පළාතේත්, ක්ෂය රෝගය හා ලයරෝග මර්ධන ජාතික වැඩ සටහනේ අධ්‍යක්ෂවරයා ලෙසත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් - වෛද්‍ය සේවා (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) ලෙසත් කටයුතු කර ඇත.

ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ MD (වෛද්‍ය පරිපාලන) විභාග මණ්ඩලයේ සභාපතිවරයා ලෙසද, කීර්තිමත් ලංකා වෛද්‍ය විද්‍යාල කවුන්සිලයේ වැඩබලන සභාපති සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රජීපාදන කොමිෂන් සභාවේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. ඔහු UNDP/UNFPA/UNICEF/WHO/ ලෝක බැංකුවේ මානව ප්‍රජනනය පිළිබඳ පයේෂණ, සංවර්ධන සහ පයේෂණ පුහුණු කිරීමේ විශේෂ වැඩසටහනේ ප්‍රතිපත්ති සහ සම්බන්ධීකරණ කමිටුවේ මූලිකත්වය ගෙන කටයුතු කරයි.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා සෞඛ්‍ය සම්බන්ධ ජාත්‍යන්තර නියෝජිත ආයතන සමඟ කටයුතු කර විශාල අත්දැකීම් ඇත්තෙකි. වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා වෛද්‍ය සේවාවට දක්වන ලද දායකත්වය වෙනුවෙන් ජාතික හා ජාත්‍යන්තර නියෝජිත ආයතන ඔහුව ඇගයීමට ලක්කර ඇති අතර ජාතික ඵලදායීතා සම්මානය කිහිපවරක් ද, සෞඛ්‍ය සඳහා මානව සම්පත් පිළිබඳ ආසියා- පැසිපික් ක්‍රියාකාරී සන්ධානය (AAAH) 2018 වසරේදී හා 2020 වසරේදී ද ඔහුව ඇගයීමට ලක්කර ඇත.

**හිරනාෂ ද මෙල් මහතා - අධ්‍යක්ෂ**

හිරනාෂ ද මෙල් මහතා වසර 25කට වැඩි විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර වල පුළුල් අත්දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ මූල්‍ය වෘත්තිකයෙක් වන අතර වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය ද ලබාගෙන ඇත. බී. ආර්. ද සිල්වා සහ සමාගම ( වරලත් ගණකාධිකාරී) ආයතනයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු ප්‍රධාන ව්‍යාපාර ආයතන ගණනාවක විගණන පලපුරුද්ද ලබාගෙන ඇති අතර පසුව ඔහු දශකය කට ආසන්න කාලයක් පුද්ගලික ආයතනයක වාණිජ සහ මූල්‍ය කටයුතු පිළිබඳ සමූහ කළමනකරු තනතුර දැරීය. මේ වන විට ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ලැයිස්තුගත ටෙලිකොම් ආයතනයක රජයේ ව්‍යවසාය ව්‍යාපාර උපාය මාර්ගයන්ට අදාල වෙළඳපොල සංවර්ධනය සහ පුළුල් කිරීම පිළිබඳ ජ්‍යෙෂ්ඨ තනතුරක් දරයි. මෙම ආයතනයේ ද වසර 15කට වැඩි පළපුරුද්දක් ඔහු සතුවේ. හිරනාෂ ද මෙල් මහතා ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය, තිරසරභාවය, ප්‍රාග්ධන කළමනාකරණය සහ අනුකූලතාව ඇතුළුව මූල්‍ය කළමනාකරණය, මූල්‍ය සේවා මුලපිරීම් ආයතනික සැලසුම් කරණය සහ වාර්තා කරණය පිළිබඳ විශේෂ ලැදියාවක් සහිත ප්‍රවීනයෙකි.

**එම්.ආර්.වී.ආර්. මීපුර මහතා - අධ්‍යක්ෂ**

FCA, MF&BE (ඇඩිලේඩ් විශ්වවිද්‍යාලය), MBS (කොළඹ විශ්වවිද්‍යාලය), BSc HRM (USJ).
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මීපුර මහතාට රාජ්‍ය අංශයේ වසර 23 කට වැඩි පළපුරුද්දක් ඇත. දැනට ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ සහ **LTL Holdings(pvt) Ltd** හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. මීට පෙර ඔහු සීමාසහිත හලාවත වැවිලි සමාගමේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලයේ (**SLAASMB**) , උක් පරයේෂණ ආයතනය, හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පයේෂණ හා පුහුණු ආයතනය හා ජාතික තරුණ සේවා සභාවෙහි භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂක වරයෙකු ලෙස සේවයකර ඇත.

**මහාචාර්ය බවන්ත ගමගේ මහතා**

MBBS,Dip in Lap Surgery(Strasbourg),FAMASI,MS,FCSSL,FRCS(Eng)

මහාචාර්ය බවන්ත ගමගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය වරයෙකි. දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ උපදේශක ශල්‍ය වෛද්‍යවරයෙකි. ඔහු සාර්ක් ශල්‍ය සත්කාර සංගමයේ ප්‍රධාන ලේකම් සහ ශ්‍රීලංකා අවම ප්‍රවේශ සහ ඩිජිටල් ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිවේ.

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
## ආයතනික තොරතුරු

**අධ්‍යක්ෂක මණ්ඩලය**

| | | |
|---|---|---|
| වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහතා | සභාපති | ( 02.12.2021දක්වා) |
| එල්. ආර්. ජයකොඩි මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | ( 15.11. 2021දක්වා) |
| වෛද්‍ය යූ.ඩී.එස්. සමරසිංහ මහතා | වැඩබලන සභාපති | ( 03.12.2021 සිට) |
| වෛද්‍ය යූ.ඩී.එස්. සමරසිංහ මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | (15.11.2021 සිට) |
| වෛද්‍ය ඒ.කේ .එස්.බී. ද අල්විස් මහතා | අධ්‍යක්ෂ | |
| මහාචාර්ය බී. ඩී. ගමගේ මහතා | අධ්‍යක්ෂ | |
| බී. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ | |
| හිරන්‍යා ද මෙල් මහතා | අධ්‍යක්ෂ | |
| ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මහත්මිය | අධ්‍යක්ෂ | (01.03.2021දක්වා) |
| එම්.ආර්.වී.ආර් මීපුර මහතා | අධ්‍යක්ෂ | (02.03.2021සිට ) |

**විගණන කමිටුව**

| | |
|---|---|
| එම්.ආර්.වී.ආර් මීපුර මහතා | සභාපති |
| හිරන්‍යා ද මෙල් මහතා | අධ්‍යක්ෂ |
| වෛද්‍ය ඒ.කේ .එස්.බී. ද අල්විස් මහතා | අධ්‍යක්ෂ |

---

**විගණකවරු**

විගණකාධිපති තුමා,
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72,
පොල්දූව පාර ,බත්තරමුල්ල.

**බැංකුකරුවෝ**

**ලංකා බැංකුව**
ආයතනික ශාඛාව, ලංකා බැංකු මාවත, කොළඹ 01.

**මහජන බැංකුව**
ජාත්‍යන්තර ශාඛාව ,තැ.පෙ ,437 .ඒ.එන්.සී.එල් ගොඩනැගිල්ල,
ඩී .ආර් .විජයවර්ධන මාවත ,කොළඹ.10

**ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව**
තැ.පෙ 37 ,112 .යෝර්ක් වීදිය ,කොළඹ.01

**කොමර්ෂල් බැංකුව**
නගර ශාඛාව 98 ,යෝර්ක් වීදිය, කොළඹ.01

**ලියාපදිංචි කාර්යාලය.**

අංක 75. සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ.01

**සංස්ථාපනය කළ දිනය**
1971සැප්තැම්බර් 22.

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කළමනාකරණ මණ්ඩලය

**කේ. එම්.ඩී.ආර්. දසනායක මහතා - සාමාන්‍යාධිකාරී**



දිනූෂ දසනායක මහතා කළමනාකාර අභ්‍යාස ලාභියෙකු ලෙස 1999 දෙසැම්බර් 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ අතර 2009 ජූනි මස 1වන දින සිට මේ දක්වා සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වරයා ලෙස කටයුතු කරයි. සාමාන්‍යාධිකාරී වරයා ලෙස පත්වීමට ප්‍රථම සංස්ථාවේ මානව සම්පත්, පරිපාලන, නීති හා ආනයන අංශවල සේවය කර ඇති අතර එම අංශවල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරයා ලෙස ද කටයුතු කර ඇත.

දිනූෂ දසනායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකි. ජපානයේ නගෝයා විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය හා විශේෂිතවූ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු වන ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයේ ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාධාරියෙකි. ඔහු බලයලත් වාණිජ සමථකරුවෙකු වශයෙන් ද සුදුසුකම් ලබා ඇත.

**සුනෙත් සුදසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)**



සුනෙත් සුදසිංහ මහතා ආයතනික මට්ටමින් දක්ෂතා පෙන්වා ඇති දක්ෂ, ප්‍රතිඵල ඉලක්ක කරගෙන කටයුතු කරන්නෙකි. ඔහු විවිධ ආයතන වල වසර විසි දෙකකට වැඩි පළපුරුද්දක් ඇති වෘත්තීය අලෙවිකරුවෙකි. සුදසිංහ මහතා ආයතනික මට්ටමේ ක්‍රියාශීලී අයෙකු වන අතර බොහෝ ව්‍යාපාර වෙනස් කිරීමට හා ගොඩනගා ගැනීමට දායක වී ඇත. 1997 දී අභ්‍යාසලාභී විකුණුම් විධායකයෙකු ලෙස තම සේවය ආරම්භ කළ ඔහු මේ දක්වා විකුණුම් කළමනාකරු, අලෙවි කළමනාකරු, සහකාර සමානාධිකාරී, සමානාධිකාරී, ප්‍රධාන වාණිජ නිලධාරී ඇතුළු ක්ෂේත්‍රයේ තනතුරු කිහිපයක් හොබවා ඇත.

සුදසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් අලෙවි කළමනාකරණ (විශේෂ) උපාධිය Bsc., රජරට විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) හා සහතික කළ කළමනාකරණ ගණකාධිකාරී වරුන්ගේ ආයතනයෙන් (CMA) ඔස්ට්‍රේලියා සාමාජිකත්වය ලබා මූල්‍ය අංශයෙන් ද සුදුසුකම් ලබා ඇත. සුදසිංහ මහතා එක්සත් රාජධානියේ ව්‍යාපාර විධායකයින්ගේ සංගමයේත්, (ABE) ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහ ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමජිකයෙක් වේ.

**ඩබ්ලිව්.ඒ.කේ.පී. වර්ණ කුමාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන හා ආනයන- ශල්‍ය හා රසායනගාර)**



ආඥාපති ( විශ්‍රාමික) ඩබ්ලිව්.ඒ.කේ.පී. වර්ණ කුමාර මහතා 2021 වසරේ අගෝස්තු මස 02 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන හා ආනයන- ශල්‍ය හා රසායනගාර) ලෙස රාජ්‍ය ඖෂධ සංස්ථාවට සම්බන්ධ විය. පසුගිය වසර 21 තුළ ඔහු ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා ප්‍රසම්පාදන, සැපයුම්දාම හා ක්‍රමකාර්‍යය සම්පාදනය සම්බන්ධයෙන් විවිධ කාර්‍යභාරයන් ඉටුකර ඇත. ඔහු කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් Logistics Management පිළිබඳ වාණිජවේදී උපාධිය (B.com)හා ශාස්ත්‍රපති උපාධිය (MBA ) ලබාගෙන ඇති අතර එක්සත් රාජධානියේ Bedfordshire විශ්ව විද්‍යාලයෙන් (Procurement Logistics & Supply Chain Management) ප්‍රසම්පාදන, සැපයුම්දාම හා ක්‍රම කාර්‍යය සම්පාදනය සම්බන්ධ විද්‍යාවේදී උපාධිය (Msc.) ලබා ඇත. ඔහු දීර්ඝකාලීන භාන්ඩ හා කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් හා අණ හා මාණ්ඩලික කටයුතු පිළිබඳ පාඨමාලාවක් ද හදාරා ඇති අතර ඔහු වරලත් ප්‍රවාහන හා ක්‍රමකාර්‍යය සම්පාදන ආයතනයේත් (Chartered Institute of Logistics & Transport) සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකාරීත්ව ආයතනයේත් එක්සත් රාජධානියේ මානවවාදී ක්‍රමකාර්‍යය සම්පාදන ආයතනයේත් (Humanitarian Logistics Association) සාමාජිකයෙකි.

# කළමනාකරණ මණ්ඩලය

**නිම්මිකා තුෂාරි මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී ( මානව සම්පත් හා පරිපාලන)**



නිම්මිකා තුෂාරි මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී ( මානව සම්පත් හා පරිපාලන) ලෙස 2018 අගෝස්තු මස 1 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිධාරිනියක් වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් ප්‍රවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. ඇයට මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳව වසර 20ක පමණ පළපුරුද්දක් ඇත.

**අයන්ති අල්විස් මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (ප්‍රසම්පාදන සහ ආනයන- ඖෂධ)**



ඒ. එච්. අල්විස් මහත්මිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (ප්‍රසම්පාදන සහ ආනයන- ඖෂධ) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී කළමනාකරණ උපාධිය (සාමාන්‍ය) සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. එයට අමතරව ඇය SLIDA හි රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලොමාධාරිනියකි.

ඇයගේ විෂය පථයට ඇතුලත්වන ආනයන අංශ හතරෙහි ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් නියමිත කාල රාමුව තුල සම්බන්ධීකරණය කිරීම හා කළමනාකරණය කිරීම ඇය විසින් සිදු කරයි.

**හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී මූල්‍ය**



හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කළමනාකරණ ගණකාධිකාරිවරිය ලෙස 2007 ජූලි මස 01 වන දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සම්බන්ධ විය. මූල්‍ය කළමනාකරණය, කළමනාකරණ ගණකාධිකරණය හා විගණනය යන අංශ පිළිබඳ වසර 23 කට වඩා පලපුරුද්දක් ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) වරලත් ගණකාධිකාරීවරියක් ද, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA) ගණකාධිකාරීවරියක් ද වේ. එක්සත් රාජධානියේ වරලත් සහතිකපත්‍ර ගණකාධිකරණ ආයතනයේ (ACCA-UK) සාමාජිකත්වය ද අපේක්ෂාවෙන් සිටී.

හිරන්‍යා සම්මන්දප්පෙරුම මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය කළමනාකරණයට විශේෂිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ගෞරව උපාධියක් 2001 වසරේදී ලබාගෙන ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියකි.

# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
**කළමනාකරණ මණ්ඩලය - ජ්‍යෙෂ්ඨ කළමනාකරණය**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.ඒ.එස්.ඩී.කේ. පෙරේරා මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -අලෙවි | (05.05.2021 දක්වා) |
| පී. දසනායක මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -ප්‍රසම්පාදන හා ආනයන (ශල්‍ය උපකරණ) | (05.05.2021 දක්වා) |
| කේ.ජී.සී. ශාන්තිමාලා මහත්මිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - තාක්‍ෂණ,රසායනාගාර හා නිෂ්පාදන | (02.11.2021 දක්වා) |
| ඒ.එච්. අල්විස් මහත්මිය | කළමනාකාරිණී - පසුබෙදාහැරීමේ කටයුතු | (01.06.2021 දක්වා) |
| පී.කේ. විජේරත්න මහත්මිය | තත්ත්ව ආරක්ෂණ රසායනාගාර කළමනාකාරිණී | |
| එම්.ඒ.වී.අයි. කුමාරසිරි මහතා | ක්ෂේත්‍ර කළමනාකරු - බෙදාහැරීම් පද්ධති සමාලෝචන | |
| ඩී.පී. අජිත් ලියනගේ මහතා | කළමනාකරු - කළමනාකරණ තොරතුරු පද්ධති | |
| පී.කේ.ආර්. ප්‍රනාන්දු මහතා | වාප්පු කළමනාකරු | |
| සී.එස්. විතානගේ මෙනවිය | අලෙවි කළමනාකාරිණී | (06.06.2021දක්වා) |
| සී.එස්. විතානගේ මෙනවිය | කළමනාකරු - ම.මි.ගැ.ඒකකය | (07.06.2021 සිට) |
| ඩී.එන්. දේවසුරේන්ද්‍ර මහත්මිය | ගණකාධිකාරිණී - ආදායම්/ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මූල්‍ය | |
| පී.ඒ.යූ. විජේවර්ධන මහත්මිය | නීති නිළධාරිණී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |
| පී.එම්.බී.ආර්. සෝමතිලක මහතා | නිෂ්පාදන කළමනාකරු | |
| ඒ.පී. හපන්ගම මහතා | ගණකාධිකාරි - මූල්‍ය ගිණුම්කරණ | |
| එම්.කේ.ඒ.පී. ගුණතිලක මහත්මිය | කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක | (04.03.2021දක්වා) |
| ඩී.ජී.ඩී.ජී. පුෂ්පකුමාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන | |
| එල්, ඩබ්ලිව්. දමයන්ති මහත්මිය | ගණකාධිකාරිණී - වැටුප් හා වේතන | |
| එම්.ඒ. එස්. කරුණාරත්න මහත්මිය | ගණකාධිකාරිණී - රාජ්‍ය ඔසුසල | |
| ඩී.කේ.ඒ.පී. දසනායක මහතා | පරිපාලන කළමනාකරු | |
| කේ.ඩී.එෆ්.එන්.පෙරේරා මහතා | විකුණුම් කළමනාකරු | |
| බී.ඒ.කේ. මදුසංක මහතා | කළමනාකරු - මානව සම්පත් | |
| ඩී.ඩී.එස්. තරංගමාලා මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන | |
| ආර්.පී. විතානගේ මහත්මිය | කළමනාකරු - ප්‍රසම්පාදන | |
| කේ.ජී.එස්. පෙරේරා මහත්මිය | ගණකාධිකාරිණී - ගෙවීම් | |
| එම්.ඒ.ඩී.එස්.එස්. මුණසිංහ මහතා | කළමනාකරු - ආනයන | |
| සී.යූ.එම්.එම්. බණ්ඩාර මහතා | කළමනාකරු - ගබඩා හා තොග පාලන | |
| එම්.කේ.සී. ක්‍රිශාන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | |
| ඩබ්ලිව්. ජයන්ත මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල කොළඹ 7. | |
| බී.ඩී.කේ. ප්‍රනාන්දු මෙනවිය | කළමනාකරු - ම.මි.ගැ.ඒකකය | (31.05.2021දක්වා) |
| එම්.ආර්.එම්.රිෆ්කාන් මහතා | කළමනාකරු - ආනයන | (16.12.2021 දක්වා) |
| එම්.ආර්.එම්.රිෆ්කාන් මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | (17.12.2021සිට ) |
| ඊ.එම්.එච්.එන්.ටී.කේ. ඒකනායක මහත්මිය | කළමනාකරු - තාක්ෂණ | |
| එච්.එන්.ජී.ඉදුනිල් මහතා | අභ්‍යන්තර විගණක | |
| ඩබ්ලිව්.ඒ ටී. ප්‍රේමවර්ධන මහතා | කළමනාකරු - රාජ්‍ය ඔසුසල | |
| අයි.ජී.ඩබ්ලිව්.එස්. විමලසේන | කළමනාකාරිණී - පර්යේෂණ හා නව ව්‍යාපෘති | (22.02.2021සිට) |
| පී.ඒ.එස්. පතිරන මහතා | ගණකාධිකාරි - තොග හා මිල කිරීම් | (01.04.2021සිට) |
| ඊ. කේ.පී.ඒ. ප්‍රියදර්ෂණී මහත්මිය | කළමනාකාරිණී - ප්‍රවර්ධන හා ප්‍රචාරක | (15.07.2021 සිට) |

# සභාපතිගේ ප්‍රකාශය -2021



2021 වර්ෂය සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලැබූ ගෞරවයක් ලෙස සලකමි. සමාලෝචිත වර්ෂයේදී, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රජයේ රෝහල් වෙත අඛණ්ඩව බෙදාහැරීම සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත තත්ත්වය සහතික කළ ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කර සපයන එකම ආයතනය ලෙස එහි 50 වන සාර්ථක වර්ෂය සම්පූර්ණ කරයි.

කොවිඩ් 19 වසංගතය විසින් අප වෙත එල්ල කරන ලද අභියෝග වලට එරෙහිව සටන් කිරීමට අප හට සිදුව තිබූ බැවින් 2021 වසර අතිශයින් අභියෝගාත්මක විය. 2021 වසරේ වසංගතය පැවති මුළු කාලය පුරා ගමනාගමනය සීමාවීම සහ සැපයුම් මාර්ග කඩාකප්පල් වීම හේතුවෙන් අපි මෙහෙයුම් අභියෝග වලට මුහුණ දුන්නෙමු. ඖෂධ ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටින ආයතනයක් ලෙස, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පළමු දිනයේ සිටම වසංගතයට එරෙහිව සටන් කිරීමට සිය හැකියාවෙන් දායකවූ අතර අපි " ජාතියට සේවය කිරීම" ප්‍රමුඛතම අරමුණ කර ගනිමින් රටේ ජනතාවට දැරිය හැකි මිලකට එන්නත් සහ තත්ත්ව සහතික කළ ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ මෙරට ජනතාවට සපයන ලදී.

ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ වෛද්‍ය සැපයුම් අංශයට ලබා දීමත්, රාජ්‍ය ඔසුසල් හා සංස්ථාවේ බෙදාහැරීමේ ජාලය හරහා විවෘත වෙළඳපලට සැපයීමත්, වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු දෙයාකාර වේ. සමාලෝචිත කාලසීමාව තුළදී, විවෘත වෙළඳපල ක්‍රියාකාරිත්වය තුළ විකුණුම් 7.4 % කින් ද, වෛද්‍ය සැපයුම් වෙනුවෙන් වූ සීමිත ප්‍රතිපාදන මධ්‍යයේ වෛද්‍ය සැපයුම් අංශයට කළ සැපයුම් 2020 වසරට වඩා 30.04 % කින් ද වැඩිවී ඇත. මෙම වසරේ දී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ බදු පෙර ලාභය රුපියල් බිලියන 3.1 ක් වූ අතර එය 2020 වසර හා සසඳන කළ 24% ක වර්ධනයකි.

ගෝලීය වසංගතයේ දිගුකාලීන බලපෑම් හේතුවෙන්, ගෝලීය හා දේශීය දෘෂ්ටිකෝණයන් අනුව බලන විට දේශීයව ඖෂධ නිෂ්පාදනයට මුලපිරීමත් ආර්ථික මන්දගාමිත්වය කරා ගමන් කිරීමත් ඉදිරි වසර වලදී "SPC" හි භූමිකාව කෙරෙහි වඩාත් අභියෝගාත්මක වනු ඇත.

මා හට ලබාදුන් සහයෝගය හා මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාට හා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ටත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාව කරගනිමි. මාගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට, කළමනාකරණ මණ්ඩලයට හා සංස්ථාවේ සියලුම කාර්‍ය මණ්ඩල සාමාජිකයින්ට මෙම දුෂ්කර කාළය තුළදී මෙපමණ දුරක් පැමිණීමට ඔවුන් දැක්වූ කැපවීම හා සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාව පුදකිරීමට කැමැත්තෙමි.

වෛද්‍ය ඩී. එස්. සමරසිංහ
වැඩබලන සභාපති

# මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

රජයේ රෝහල් වලට ඖෂධ හා ශල්‍ය උපකරණ අඛණ්ඩව බෙදාහැරීම සඳහා රජයේ බෙහෙත් ගබඩාවට තත්ත්ව ආරක්ෂිත ඖෂධ හා ශල්‍ය උපකරණ සපයන ප්‍රධාන ආනයනකරුවෙකු වන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවයි. එසේම, දිවයින පුරා පිහිටා ඇති රාජ්‍ය ඔසුසල ශාඛා, බලයලත් වෙළඳුන් හා බෙදාහරින්නන් හරහා රාජ්‍ය ඖෂධ සංස්ථාව ආනයනික ඖෂධ විවෘත වෙළඳපොළ තුල බෙදාහරියි. 2020 මාර්තු මාසයේ සිට කොවිඩ් 19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා රටපුරා ක්‍රියාත්මක කරන ලද හදිසි තත්ත්වයන් අතරදීත් සලකා බලන වර්ෂය තුළ ඖෂධ නීතිගත සංස්ථාව සතුටුදායක කාර්යසාධනයක් ලබාදී ඇත.

## මූල්‍ය කාර්යසාධනය

### සමස්ත මූල්‍ය කාර්යසාධනය

මෙම වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මෙතෙක් වාර්තා කරගත් ඉහලම පිරිවැටුම වූ රු. මි. 80,258 වාර්තා කර ගන්නා ලද අතර එහි කොවිඩ් එන්නත් ආනයනය කිරීමේ පිරිවැටුම වන රු. 13,887 ක් ද ඇතුලත් විය. මෙය පෙර වර්ෂයේ වාර්තාවූ රු.මි.63,121 ක පිරිවැටුම හා සැසඳීමේ දී 27% ක වර්ධනයකි. 2021 වසරේ දී ඖෂධ නීතිගත සංස්ථාවේ බදුපෙර ලාභය රු.මි.3156 විය. පෙර වසරේ වාර්තා කරගන්නා ලද රු.මි.2545 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී එය 24% ක වර්ධනයකි. රජයේ බෙහෙත් ගබඩාවේ ඇනවුම් අවශ්‍යතා මත රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම් ඉහල යාම මෙම ලාභයේ වර්ධනයට මූලික හේතුව විය.




### රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම්

මෙම වර්ෂයේ දී රු. මි. 70,811 ක ඖෂධ හා ශල්‍ය උපකරණ රජයේ බෙහෙත් ගබඩාවට සපයන ලදී. එය 2020 වසරේ සපයන ලද වටිනාකම වූ රු.මි.54,323 ක වටිනාකම හා සැසඳීමේ දී 30% ක වර්ධනයකි. මෙම වටිනාකම තුල කොවිඩ් එන්නත් ආනයනය කර රජයේ බෙහෙත් ගබඩාවට සැපයූ වටිනාකම වන රු. 13,887 ක් ද ඇතුලත් විය. සලකා බලන වසරේ දී රජයේ බෙහෙත් ගබඩාවට කරන ලද සැපයුම් මත ඖෂධ නීතිගත සංස්ථාවේ බදුපෙර ලාභය රු.මි.2450 විය. 2020 වසරේ වාර්තා කරගන්නා ලද රු. 1615 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී එය 51% ක වර්ධනයකි. කෙසේ වුවද, අප විසින් රජයේ බෙහෙත් ගබඩාවට එන්නත් සැපයීමේදී අදාල වියදම් පියවා ගැනීම සඳහා පමණක්වූ විශේෂ සේවා ගාස්තුවක් අයකළ බව මෙහිදී අවධාරණය කළ යුතුවේ.




### විවෘත වෙළඳපොළ මෙහෙයුම්

කොවිඩ් 19 වසංගතය ඖෂධ සහ සනීපාරක්ෂක අයිතම සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස වෙනස් කරන ලදී. රාජ්‍ය ඖෂධ සංස්ථාව මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් වෙළඳපොළේ ඖෂධ හා සනීපාරක්ෂක අයිතම ලබාගැනීමේ හැකියාව සහතික කරන ලදී. විවෘත වෙළඳපොළ මෙහෙයුම් තුලින් 2021 වසරේ දී රු. මි. 9,446 ක පිරිවැටුමක් වාර්තා කර ගන්නා ලදී. 2020 වසරේ වාර්තා කරගත් රු මිලියන 8,798 ක් වූ පිරිවැටුම හා සැසඳීමේ දී 7% වර්ධනයකි. මෙම වර්ධනයට ප්‍රධාන හේතු වූයේ ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් නව රාජ්‍ය ඔසුසල අලෙවිසැල් තුනක් ස්ථාපිත කිරීම මඟින් ඖෂධ සංස්ථාවේ බෙදාහැරීමේ මාර්ග පුළුල් කිරීමත් වේ. සලකා බලන වසරේ දී විවෘත වෙළඳපොළ මෙහෙයුම් තුලින් ලද බදුපෙර ලාභය රු.මි.705 විය. 2020 වසරේ වාර්තා කරගන්නා ලද රු. 929 ක බදු පෙර ලාභය හා සැසඳීමේ දී එය (24% )ක අඩුවීමකි.






**බදුකරණය**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රාජ්‍ය භාණ්ඩාගාරයට ආදායම් බදු වශයෙන් රු. මිලියන 698.6 ක් මෙම වසරේ ගෙවා ඇත.

**ඖෂධ වෙළඳාම හා ප්‍රවර්ධනය**

2021 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් නව රාජ්‍ය ඔසුසල තුනක් මැදවච්චිය,පිටකෝට්ටේ සහ හොරණ නගර වල පිහිටුවන ලදී. වර්ෂය අවසානයේ දී ඖෂධීය නාමයෙන් යුතු ඖෂධ බෙදාහැරීම සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ බෙදාහැරීම් ජාලය සතුව, රාජ්‍ය ඔසුසල 50 ක්, බෙදාහරින්නන් 51 හා වරලත් හා බලයලත් වෙළඳුන් 107 ක් දිවයින පුරා ක්‍රියාත්මකව පැවතුනි. රට අගුලු දමා ඇඳිරි නීතිය පැවතුන කාලය තුල සාමාන්‍ය ජනතාවට වඩාත් ඵලදායී කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා, සංස්ථාව  විසින් රාජ්‍ය ඔසුසල අලෙවිසැල් හරහා අත්‍යවශ්‍ය ඖෂධ නිවෙසටම ගෙනවිත් දීමේ යාන්ත්‍රණය 2021 වසරේදී ද ක්‍රියාත්මක කරවන ලදී.

**තාක්ෂණ හා රසායනාගාර**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රසායනාගාරයේ ගුණාත්මක භාවය වර්ධනය කරගනිමින් ඉහල මට්ටමකින් පවත්වාගෙන යාමට තවදුරටත් කැපවන අතර සංස්ථාවේ ඖෂධ සෑම විටම ගුණාත්මක භාවයෙන් පවත්වාගෙන යාම සඳහා "ටෙන්ඩර් නියදි පරීක්ෂාව", "නැව්ගත කිරීමට පෙර ලබාගත් නියදි පරීක්ෂාව", "බෙදාහැරීමට පෙර නියදි පරීක්ෂාව" සහ මහජනතාව වෙත බෙදාහැරීමෙන් පසු "වෙළඳපල පැමිණිලි මත නියැදි පරීක්ෂාව" යන අධියර හතරක් යටතේ පරීක්ෂාවට ලක්කරයි.

**මානව සම්පත් සංවර්ධනය**

සලකා බලන වර්ෂය අවසානයේ දී අපගේ මුළු ශ්‍රමබලකාය 1085 ක් වූ අතර එයින් 137 ක් පුහුණුවන්නන් විය. සේවකයින් සඳහා වඩාත් හොද ආරක්ෂිත වටාපිටාවක් සැලසීම වෙනුවෙන්, රට අගුළුදමා තිබූ කාලසීමාව තුල ප්‍රවාහන පහසුකම් සලසා දෙන ලදී. සමහර වාර්ෂික උත්සව අංගයන් අතහැර දැමීමට සිදුවුවද,  සංස්ථාවේ 2020 වසරට පෙර පැවති සේවක සුභසාධන ප්‍රතිලාභ 2021 වසරේ දී ද සේවකයන් වෙත ලබා දෙන ලදී.

**ආයතනික සමාජ වගකීම**

අපගේ ආයතනික සමාජ වගකීමෙහි කොටසක් ලෙස වසර 5ට අඩු දරුවන්, ගැබිනි මව්වරුන්, වයස 55ට වඩා වැඩි වැඩිහිටියන් මිලදී ගන්නා ඖෂධ වෙනුවෙන් 5% ක වට්ටමක් ලබාදීම මෙම වසරේදීත් සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

**අනාගතය**

SPC"උසස්, තත්ත්වය සහතික කල ආරක්ෂාකාරි හා ප්‍රතිඵලදායක ඖෂධ හා සනීපාරක්ෂක උපකරණ සාධාරණ මිලට සපයා ජනතාවට සේවය සැපයීම" වන තම ප්‍රමුඛ අරමුණ සාර්ථක කරගනිමින් ලාභ උපයන ආයතනයක් ලෙස පවත්වා ගෙනයාම සංස්ථාවේ අරමුණයි.

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් තුමා විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 වගන්තියට අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**ආරම්භය**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ අංක 14976/8 දරණ ගැසට් නිවේදනය මඟින් 1971 සැප්තැම්බර් 22 වන දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට කාර්මික හා විද්‍යා කටයුතු අමාත්‍යතුමාගේ නියෝගය මත රුපියල් මිලියනයක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවන ලදී.

**ගණකාධිකරණ ප්‍රතිපත්ති**

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිටු අංක 18 සිට 30 දක්වා ඉදිරිපත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවිය.

**ප්‍රතිඵල**

ප්‍රවර්ථන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස් වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මඟින් අනාවරණය කර ඇත.

**ව්‍යාපාර සමාලෝචනය**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශේෂ පත්‍රයෙහි දක්වා ඇති අතර ඒ පිළිබඳ ඇගයීමක් මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනයෙහි ඇතුලත් කර ඇත.

**දේපළ, පිරියත හා උපකරණ**

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්ථන වසරට අදාලව දේපළ, පිරියත හා උපකරණ වල සිදුවූ වෙනස්කම් සටහන් අංක 16 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොළ අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- විවෘත වෙළඳපොල වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.
- ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම.
- රසායනාගාර පහසුකම් සහ වෛද්‍ය පරීක්ෂණ පහසුකම් සැපයීම.

පසුගිය මූල්‍ය වර්ෂය තුල සංස්ථාවේ ක්‍රියාකාරකම් වල මූලික වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

**සංචිත**

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල සංස්ථාවේ මූල්‍ය සංචිත වල වටිනාකම හා එහි සංයුතිය දක්වා ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

2021 දෙසැම්බර් 31 වන දිනට පත්ව සිටී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වෛද්‍ය. යූ.ඩී.එස්. සමරසිංහ මහතා | වැඩබලන සභාපති | ( 03.12.2021 සිට) |
| වෛද්‍ය. යූ.ඩී.එස්. සමරසිංහ මහතා | කළමනාකාර අධ්‍යක්ෂ | (15.11.2021 සිට) |
| මහාචාර්ය බී.ඩී. ගමගේ | අධ්‍යක්ෂ | |
| වෛද්‍ය. ඒ.කේ .එස්.බී .දි අල්විස් | අධ්‍යක්ෂ | |
| හිරන්‍යා ද මෙල් මහතා | අධ්‍යක්ෂ | |
| බී. ගුණරත්න මහතා | අධ්‍යක්ෂ | |
| එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | අධ්‍යක්ෂ | (02.03.2021 සිට) |

**විගණන කමිටුව**
රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට (Public Enterprises Guideline) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

**සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය**
ශක්තිමත් සාංගමික යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව මඟින් විධික්‍රම හා ක්‍රියා පටිපාටීන් ක්‍රියාත්මක කර ඇත. පිටු අංක 13 හි විගණන කමිටු වාර්තාව දක්වා ඇත.

**සේවා නියුක්තිය**
සේවකයන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා යෝග්‍ය වන මානව සම්පත් කළමනාකරණ ක්‍රියා මාර්ග හා ප්‍රතිපත්ති සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරයි.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
රජයට සහ සේවකයන් හට ගෙවීමට නියමිත සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි ගෙවා නිමකර ඇත.

**පාරිසරික ආරක්ෂාව**
පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමකට සංස්ථාව මැදිහත්වී නොමැත.

**රජයට දායකත්වය**
ලාභ ලබන රාජ්‍ය සංස්ථාවක් ලෙස මෙම වසරේදී රුපියල් මිලියන 698.6 ක් ආදායම් බදු ලෙස රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවා ඇත.

**සංයුක්ත සමාජමය වගකීම**
සමාජමය වගකීම් ලෙස සලකා සංස්ථාව විසින් රු. 1,066,944/- ක ප්‍රදානයන් ප්‍රවර්ථන වර්ෂය තුලදී සිදුකර ඇත.

**ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**
ශේෂපත්‍ර දිනට පසු ගිණුම් මඟින් ගැලපීමට හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තාවී නොමැත.

**විගණකවරු**
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති තුමා විසින් විගණනය කරන ලදී.

**අධ්‍යක්ෂ මන්ඩලයේ නියෝග මත**



................................
අනුරාධා විජයවර්ධන
නීති නිළධාරිණී/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# විගණන කමිටුවේ වාර්තාව

**විගණන කමිටුවේ සංයුතිය**

විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකු ඇතුලත් වන අතර කමිටුවේ සභාපතිවරයා ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂවරයා කටයුතු කරයි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂය තුල පහත සාමාජිකයන් විගණන කමිටුවට සහභාගී විය.

| | |
|---|---|
| එම්.ආර්.වී.ආර් මීපුර | - සභාපති |
| හිරනායා ද මෙල් මහතා | - කමිටු සාමාජික |
| වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා | - කමිටු සාමාජික |

ඖෂධ නිශ්පාදන,සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි තුමා හා රජයේ විගණන අංශයේ සංස්ථා කාර්‍යාලයේ විගණන අධිකාරි තුමා සමීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී විය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තුමිය හා අභ්‍යන්තර විගණක, විගණන කමිටු ලේකම් හා කැඳවුම්කරු ලෙස පිළිවෙලින් කටයුතු කරන ලදී.

**විගණන කමිටුවේ කාර්‍යභාරය**

විගණන කමිටුවේ ප්‍රධාන කාර්‍යය වනුයේ සංස්ථාවේ පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීමත්, සංස්ථාවේ විගණන කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සමාලෝචනයන් හා නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීමත් වේ. සමාලෝචිත වර්ෂය තුලදී කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් වල නියැලෙන ලදී.

01. අභ්‍යන්තර විගණන සැලසුම් ඇගයීම, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හි සංශෝධනය කිරීමට නිර්දේශ කිරීම.
02. 2021 වසරට අදාල අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම හා අනුමත කිරීම.
03. අභ්‍යන්තර විගණනය මඟින් පෙන්වා දී ඇති කරුනු හා නිර්දේශ සඳහා කළමනාකරණයේ ප්‍රතිචාරයන් විමර්ශනය කිරීම හා අභ්‍යන්තර විගණන වාර්තාවන් සමාලෝචනය කිරීම.
04. 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7) (ඒ) සහ 14(2) (සී) වගන්ති ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කර ඇති වාර්තාවන්හි දක්වා ඇති කරුණු සමාලෝචනය කිරීම.
05. රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

**අභ්‍යන්තර විගණන අංශය**

විගණන කමිටුවේ මඟ පෙන්වීම යටතේ සමාලෝචිත වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අභ්‍යන්තර විගණන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදී. තවද අභ්‍යන්තර විගණන අංශයේ පද්ධති හා මූල්‍ය විගණන ක්‍රියාමාර්ග තුලින් අකාර්යක්ෂම පිළිවෙත් බැහැර කිරීමත්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කිරීමත්, සිදුවිය හැකි වැරදි වංචා හා පාඩු අවම කර ගැනීමටත් කටයුතු කරන ලදී.

**රැස්වීම්**

2021 වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. එහිදී හඳුනා ගන්නා ලද අඩුලුහුඩුකම් හා නිර්දේශ කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. එම අඩුලුහුඩුකම් හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කොට ඇත.

.......................................................

**එම්.ආර්.වී.ආර් මීපුර**
**විගණන කමිටුවේ සභාපති**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31වන දිනට | සටහන | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | **16** | 2,084,196,680 | 2,008,431,794 |
| භාවිත අයිතිය සහිත වත්කම් | **17** | 44,133,149 | 41,966,690 |
| සම්පූර්ණයෙන් ගෙවනලද කල්බදු වත්කම් | **18** | 22,064,222 | 22,841,696 |
| නොනිමි වැඩ - ප්‍රාග්ධනය | | 38,311,359 | 120,667,085 |
| අස්පෘශ්‍ය වත්කම් - මෘදුකාංග | **19** | 2,567,274 | 2,800,662 |
| විලම්බිත බදු වත්කම් | **20** | 160,331,877 | 132,780,568 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,351,604,561** | **2,329,488,495** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොගය - රා.ඖ.සං | **21** | 2,396,405,789 | 2,751,097,855 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග. | **22** | 936,743,053 | 1,314,756,504 |
| වෙළඳ හා වෙනත් ණයගැතියෝ | **23** | 52,098,808,812 | 33,695,827,140 |
| පෙරගෙවීම් | **24** | 41,905,706 | 100,917,075 |
| බැංකු හා අතැති මුදල් | **25** | 1,111,456,668 | 1,225,357,866 |
| **මුළු ජංගම වත්කම්** | | **56,585,320,029** | **39,087,956,440** |
| **මුළු වත්කම්** | | **58,936,924,589** | **41,417,444,935** |
| | | | |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | **31** | 59,055,258 | 59,055,258 |
| රඳවාගත් ඉපයුම් | | 14,650,681,709 | 12,208,679,398 |
| පොදු සංචිතය | **32** | 66,061,447 | 66,061,447 |
| **මුළු ස්කන්ධය** | | **14,775,798,414** | **12,333,796,103** |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | **26** | 470,173,261 | 495,666,216 |
| දිගුකාලීන කල්බදු වගකීම් | **17.1** | 28,587,360 | 27,851,418 |
| දිගුකාලීන ණය | **27** | 9,405,711,108 | 11,384,644,444 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **9,904,471,729** | **11,908,162,078** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ණයහිමියෝ | **28** | 16,164,216,448 | 16,131,036,325 |
| ආදායම් බදු බැඳියාව | | 576,606,572 | 475,495,889 |
| විලම්බිත ආදායම් | | 1,471,313 | 1,799,766 |
| කල්බදු වගකීම් | **17.1** | 21,759,130 | 19,870,218 |
| ජංගම මූල්‍ය වගකීම් | **29** | 15,432,056,540 | 55,929,000 |
| දිගුකාලීන ණය | **27** | 2,060,544,444 | 491,355,556 |
| **මුළු ජංගම වගකීම්** | | **34,256,654,446** | **17,175,486,753** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **58,936,924,589** | **41,417,444,935** |

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත පරිදි අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| ................................. | ................................. | ................................. |
| වෛද්‍ය.<br>යූ.ඩී.එස්.සමරසිංහ<br>වැඩබලන සභාපති | කේ.එම්.ඩී.ආර්.<br>දසනායක<br>සාමාන්‍යාධිකාරී | නිශාන්ති දේවසුරේන්ද්‍ර<br>වැඩබලන නියෝජ්‍ය<br>සාමාන්‍යාධිකාරී - මූල්‍ය |

පිටු අංක ... සිට... දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම ගිණුම් වාර්තාව හා සබැඳි අත්‍යාවශ්‍ය කොටස්වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. | පොදු සංචිතය රු. | ඒකාබද්ධ ලාභාලාභ ගිණුම රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | 59,055,258 | 66,061,447 | 8,769,268,475 | 8,894,385,180 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | 1,663,869,219 | 1,663,869,219 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | (1,926,328) | (1,926,328) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **10,431,211,366** | **10,556,328,071** |
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | 59,055,258 | 66,061,447 | 10,431,211,366 | 10,556,328,071 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | 1,969,223,517 | 1,969,223,517 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | (191,755,485) | (191,755,485) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **12,208,679,398** | **12,333,796,103** |
| **2021 ජනවාරි 01 වන දිනට ශේෂය** | 59,055,258 | 66,061,447 | 12,208,679,398 | 12,333,796,103 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | | | |
| වසරේ ශුද්ධ ලාභය | | | 2,384,563,878 | 2,384,563,878 |
| වසරට අදාල විශ්‍රාමික පාරිතෝෂික අතිරික්තය/හිඟය (සටහන26.3) | | | 57,438,433 | 57,438,433 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **59,055,258** | **66,061,447** | **14,650,681,709** | **14,775,798,414** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | ක්‍රියාකාරකම් ර.ඖ.ස 2021 රු. | ක්‍රියාකාරකම් ර.බෙ.ග 2021 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2021 රු. | සමස්ථ ක්‍රියාකාරකම් 2020 රු. |
|---|---|---|---|---|---|
| ආදායම | **7** | **9,446,822,118** | **70,811,344,509** | **80,258,166,627** | **63,121,611,706** |
| අඩුකලා | | | | | |
| සෘජු වියදම් - ර.බෙ.ග. | **8** | | 66,269,228,066 | 66,269,228,066 | 50,908,491,858 |
| විකුණුම් පිරිවැය - රා.ඖ.ස. | **9** | 7,085,466,342 | | 7,085,466,342 | 6,435,740,565 |
| නිෂ්පාදන පිරිවැය - ජීවනී ඒකකය | **10** | 136,819,315 | | 136,819,315 | 112,630,601 |
| **දළ ලාභය/ අතිරික්තය** | | **2,224,536,461** | **4,542,116,443** | **6,766,652,904** | **5,664,748,681** |
| **එකතු කලා:- වෙනත් මෙහෙයුම් ආදායම්** | **11** | 88,531,203 | - | 88,531,203 | 287,363,124 |
| **අඩුකලා:-** | | | | | |
| පරිපාලන වියදම් | **12** | 1,321,886,163 | 645,273,292 | 1,967,159,456 | 1,753,833,505 |
| වෙනත් මෙහෙයුම් වියදම් | **13** | 281,495,234 | 876,556,403 | 1,158,051,637 | 962,078,319 |
| **මෙහෙයුම් ලාභය** | | **709,686,266** | **3,020,286,748** | **3,729,973,014** | **3,236,199,981** |
| **අඩුකලා: මූල්‍ය වියදම්** | **14** | 10,685,438 | 569,494,709 | 580,180,147 | 697,466,041 |
| **එකතුකලා: මූල්‍ය ආදායම් (සේවක ණය පොළී)** | | 6,943,197 | - | 6,943,197 | 6,890,528 |
| **බදු වලට පෙර ලාභය** | | **705,944,024** | **2,450,792,039** | **3,156,736,063** | **2,545,624,468** |
| ආදායම් බදු වියදම | **15** | 172,681,633 | 599,490,551 | 772,172,185 | 576,400,951 |
| **බදු වලට පසු ලාභය** | | **533,262,391** | **1,851,301,488** | **2,384,563,878** | **1,969,223,517** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පාරිතෝෂික වෙන්කිරීම මත අතිරික්තය/ ඌනතාව | **26** | 25,272,911 | 32,165,522 | 57,438,433 | (191,755,485) |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | **558,535,301** | **1,883,467,010** | **2,442,002,311** | **1,777,468,032** |

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | සටහන | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | | **3,156,736,063** | **2,545,624,468** |
| **ගැලපීම්:** | | | |
| ක්ෂය කිරීම් | 16 | 81,750,446 | 91,262,460 |
| ස්ථාවර වත්කම් අගය අඩුවීම්/ගැලපීම් | 16 | 6,640,642 | |
| විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් | 26.3 | 73,805,510 | 64,645,469 |
| කල්බදු ක්‍රමක්ෂය - රත්මලාන | 18 | 777,474 | 777,474 |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය/අලාභය | | (1,854,296) | - |
| මෘදුකාංග ක්‍රමක්ෂය | 19 | 816,860 | 700,166 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම | 7 | (9,068,148) | (1,125,679) |
| කල්බදු පොලිය ( ඔසුසල) | | 8,455,972 | 8,326,647 |
| භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය | | 26,149,892 | 23,400,940 |
| බොල්ණය අයකර ගැනීම් -රා.ඖ.ස. | 11 | (15,654,623) | |
| බොල්ණය සඳහා වෙන්කිරීම -ර.බෙ.ග. | 13 | 493,742,965 | 597,927,077 |
| තොග අලාභ | 13 | 319,034 | 1,137,164 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- රා.ඖ.ස | 13 | 128,932,861 | 103,644,268 |
| හානි වූ හා කල්ඉකුත්වූ තොග සඳහා වෙන්කිරීම- ර.බෙ.ග | 13 | 28,505,210 | 93,389,052 |
| පොලී වියදම් | 14 | 569,624,426 | 695,204,980 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **4,549,680,288** | **4,224,914,486** |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ වැඩිවීම/අඩුවීම | 23 | (18,896,724,637) | (6,994,123,808) |
| තැන්පතු සහ පෙරගෙවීම් වැඩිවීම/අඩුවීම | 24 | 59,011,369 | (46,985,921) |
| වෙළඳ තොග වැඩිවීම/අඩුවීම | | 234,508,319 | (52,733,861) |
| මාර්ගස්ථ තොගය වැඩිවීම/අඩුවීම | 22 | 349,508,241 | (1,127,422,755) |
| වෙළඳ ණයහිමියෝ වැඩිවීම/අඩුවීම | 28 | 33,180,124 | (162,702,829) |
| විලම්බිත ආදායම් වැඩිවීම/අඩුවීම | | (328,453) | 338,297 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | **(13,655,510,128)** | **(4,158,716,390)** |
| ආදායම් බදු ගෙවීම් | | (698,612,812) | (553,746,299) |
| පාරිතෝෂික ගෙවීම් | 26 | (41,860,032) | (15,687,456) |
| පොලී ගෙවීම් | 14 | (569,624,426) | (695,204,980) |
| **විශේෂිත අයිතම වලට පෙර මුදල් ප්‍රවාහය** | | **(1,310,097,270)** | **(1,264,638,735)** |
| | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(14,965,607,397)** | **(5,423,355,125)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | 16 | (167,278,573) | (30,493,744) |
| නොනිම්වැඩ වැඩිවීම/අඩුවීම | | 82,355,726 | (22,735,539) |
| පරිගනක මෘදුකාංග | 19 | (583,471) | (3,500,828) |
| ස්ථාවර වත්කම් විකිණීම් | | 4,976,896 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් උපයෝජනය** | | **(80,529,422)** | **(56,730,111)** |
| **මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දිගුකාලීන ණය ලැබීම් | 27 | - | 11,876,000,000 |
| දිගුකාලීන ණය ගෙවීම් | | (409,744,448) | - |
| කල්බදු වාරික ගෙවීම් | | (34,147,469) | (29,993,739) |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (443,891,917) | 11,846,006,261 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ ශුද්ධ වැඩිවීම** | | (15,490,028,737) | 6,365,921,025 |
| **වර්ෂය මුල මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **1,169,428,866** | **(5,196,492,160)** |
| | | | |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන- අ.)** | | **(14,320,599,871)** | **1,169,428,866** |

| සටහන (අ) මුදල් හා මුදල් වලට සමාන දෑ | | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| අතැති මුදල් සහ බැංකු මුදල් | 25 | 1,007,854,541 | 1,128,932,855 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 25 | 103,602,127 | 96,425,011 |
| බැංකු අයිරාව | 29 | (15,432,056,540) | (55,929,000) |
| **වර්ෂය අග මුදල් හා මුදල් වලට සමාන දෑ** | | **(14,320,599,871)** | **1,169,428,866** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1.ආයතනික තොරතුරු

### 1.1 පිහිටීම හා නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 දී රාජ්‍ය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කර ඇති අතර අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01. යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

### 1.2. ගිණුම් කාලපරිච්ඡේදය

2021 ජනවාරි මස 1 වන දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාල සීමාව සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ගිණුම් පිළියෙල කරයි.

### 1.3. ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

අ. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම විවෘත වෙළඳ පොලට ආනයනය කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ බෙදාහැරීම.

ආ. රාජ්‍ය බෙහෙත් ගබඩාවට අවශ්‍ය ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.

ඇ. ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් (B.B. Cream) ඇතුළු අයිතම ගණනාවක් නිෂ්පාදනය කර විකිණීම.

ඈ. රසායනාගාර පහසුකම් සැපයීම සහ ඖෂධ නියැදි පරීක්ෂාව.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය වාර්තා පිළියල කිරීමට භාවිතා කරනලද මූලික ගණකාධිකරන ප්‍රතිපත්ති සටහන් අංක 3 සිට 6 දක්වා ඉදිරිපත් කර ඇති අතර විශේෂයෙන් සඳහන් කර නොමැති විට ඒවා නියමාකාරයෙන් භාවිත කර ඇත. ඖෂධ සංස්ථාවේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට ( සාමාන්‍ය ව්‍යවහාරයේ පරිදි "SLFRS"/ "LKAS") අනුකූලව පිළියල කර ඇත. මෙම මූල්‍ය වාර්තා වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයක්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයක්, ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා සටහන් ඇතුලත් වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකශන සඳහා ඔවුන්ගේ වගකීම පිළිගන්නා අතර නිකුත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන වල කිසියම් සංශෝධන වේනම් එය නිවැරදි කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

### 2.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය

2022 අප්‍රේල් මස 18 දින ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

### 2.4. මිණුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් පහත ද්‍රව්‍යමය කරුණු හැර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- ගෘහ භාණ්ඩ, උපකරණ හා පරිගණක නැවත තක්සේරු කර සාධාරණ වටිනාකම ලෙස ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා ඇත.
- විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ආයුගණක තක්සේරු වටිනාකමට දක්වා ඇත.

අවශ්‍ය අවස්ථාවලදී, අදාල නිශ්චිත ප්‍රතිපත්ති සටහන් මඟින් විස්තර කර ඇත.

### 2.5. භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සංස්ථාවේ භාවිත වන හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් සංස්ථාවේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

**2.6. සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම හා සංසන්දනය පහසු කරලීම සඳහා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති සියලු වටිනාකම් වෙනුවෙන් ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා සවිස්තර සහිත පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු දක්වා ඇත. අවශ්‍ය අවස්ථාවලදී, ප්‍රවර්ථන වසරේ ඉදිරිපත් කිරීම් වලට අනුකූලව පෙර වසරේ සංසන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඇත.

**2.7. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ- LKAS 7 ( මුදල් ප්‍රවාහ ප්‍රකාශ) දක්වා ඇති ඍජුක්‍රමය භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියල කර ඇති අතර මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලට අදාල දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් හඳුනාගෙන දක්වා ඇත.

2.8. **සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන**.

මෙම ගිණුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී, සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති වලට සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වලට බලපාන තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන කළමනාකරණය විසින් ගන්නා ලදී. සත්‍ය ප්‍රතිපලය එම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා දක්වා ඇති උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට ලක් කරයි. ගිණුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන, අදාල සංශෝධන සිදුකරන වසර හා ඉදිරි කාලපරිච්ඡේද වලට අදාල වන පරිදි ගලපයි.
මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වටිනාකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිත තාවයන් පිළිබඳ තොරතුරු පහත සටහන් වලට ඇතුලත් කර ඇත.

සටහන 25 - විලම්බිත බදු වත්කම්/වගකීම් හඳුනාගැනීම

සටහන 21 - අඩමාන ණය සඳහා වෙන්කිරීම

සටහන 24 - විශ්‍රාමික පාරිතෝෂික බැදියාව ඇගයීම; මූලික ආයුගණක උපකල්පන

සටහන 18 - කල්බදු

වෙන්කිරීම්: අතීත සිදුවීම් වල ප්‍රතිපලයක් වශයෙන් වර්තමානයේ සංස්ථාවට නීතිමය හෝ වටහාගත හැකි බැදීමක් ඇති විට, වියහැකි සම්භාවිතාව සලකා බලා විශ්වාසදායක තක්සේරුව මත පදනම්ව වෙන්කිරීම් සිදුකරයි.

**2.9 සාධාරණ අගය තක්සේරු කිරීම**

සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙලිදරව් කිරීම් ගණනාවක් සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තක්සේරු කිරීමට අවශ්‍යවේ. කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිපලයක් ලෙස මූල්‍ය වෙළඳපොලෙහි අස්ථාවරත්වයක් ඇති වී ඇත. කෙසේ වුවද කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිපලයක් ලෙස මූල්‍ය වෙළඳපොලෙහි ඇතිවූ අස්ථාවරත්වය හේතුවෙන් සංස්ථාවට තම මූල්‍ය වත්කම් කිසිවක් නැවත වර්ගීකරණය කිරීමට අවශ්‍යවී නොමැත.
සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් සහ තක්සේරුකරණ ගැලපුම් ද නිරන්තරයෙන් සමාලෝචනය කරයි.වෙළඳ වටිනාකම තක්සේරු කිරීම සඳහා තෙවන පාර්ශවයක තොරතුරු භාවිතා කරයි නම්, නිගමනයට සහාය වීම සඳහා තෙවන පාර්ශවයෙන් ලබාගත් සාක්ෂි එවැනි තක්සේරු කිරීම් වර්ගීකරණය කළ යුතු සාධාරණ අගය ධූරාවලියෙහි මට්ටම ද ඇතුලත් SLFRSs/LKASs හි අවශ්‍යතා සපුරන බවට සංස්ථාව නැවත තහවුරු කර ගනියි.

තවද, සැලකියයුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ කර ගනියි නම්: බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේදී වෙළඳපොල දැනුම, කීර්තිය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගෙනයන්නේ ද යන්න සළකා බලයි. බාහිර තක්සේරු කරුවන් සමඟ සාකච්ඡාකර, ඒ ඒ වත්කම සඳහා කුමන යෙදවුම් හා කුමන තක්සේරු ක්‍රමය භාවිතා කළයුතු ද යන්න සංස්ථාව තීරණය කරයි.

සැලකිය යුතු තක්සේරුකරණ ගැටළු විගණන කමිටුවට වාර්තා කරනු ලබයි. වත්කමක හෝ වගකීමක සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී, සංස්ථාව හැකි පමණ නිරීක්ෂණය කලහැකි වෙළඳපොල තොරතුරු භාවිතා කරයි. තක්සේරු කරණයේදී භාවිතා කල යෙදවුම් පදනම් කර ගනිමින් සාධාරණ අගය මට්ටම් ධූරාවලියෙහි මට්ටම් වලට වෙළඳ වටිනාකම වර්ගීකරණය කර දක්වන ක්‍රම පහත පරිදි වේ.

• මට්ටම 1: සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපල වල මිල ගනන් (සකස් නොකළ)

• මට්ටම 2: 1 වන මට්ටමට ඇතුලත් කර ඇති මිල ගණන් හැර වත්කම් හෝ වගකීම් සඳහා කෙලින්ම නිරීක්ෂණය කලහැකි වෙනත් යෙදවුම් ( උදා: මිල ගනන්) හෝ වක්‍රාකාරව ( උදා: මිල ගනන් වලින් උපුටාගත්)

• මට්ටම 3: වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කල හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ යෙදවුම් ( නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

වත්කමක හෝ වගකීමක වෙළඳපොල වටිනාකම ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් වලට වැටේ නම්, සාධාරණ අගය මැනීම, සමස්ත අගය සඳහාම වැදගත් වන අවම ආදාන මට්ටම ලෙස සාධරණ අගය ධූරාවලියේ එකම මට්ටමින් වර්ගීකරණය කර ඇත. සධාරණ අගය ධූරාවලියේ විවිධ මට්ටම් අතර මාරුකිරීම අදාල වෙනස සිදුවූ වර්ෂය අවසානයේ දී සිදුකරයි. ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල යටතේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට (OCI) ගණන් ගැනෙන වත්කම් කිසිවක් දැනට සංස්ථාව සතුව නොමැත.

## 3 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 3.1. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාව විසින් භාවිතා කරන ලද මූලික ගිණුම්කරන ප්‍රතිපත්ති විශේෂයෙන් දක්වා නොමැති විට පෙර වර්ෂයේ ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුරූපවේ. ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවල පෙර වර්ෂයේ සංඛ්‍යා හා වාක්‍ය කණ්ඩ නැවත සකසා ඇත.

### 3.2. අඛණ්ඩ පැවැත්ම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේ පදනම තීරණය කිරීමේදී, සංස්ථාවට COVID-19 හී පවත්නා සහ අපේක්ෂිත බලපෑම් පවතින තොරතුරු පදනම්ව කළමනාකරිත්වය විසින් තක්සේරුකර දිගින් දිගට පැවැත්මේ සංකල්පය අනුව ගිණුම් පිළියල කිරීම යෝග්‍ය බව තීරණය කරන ලදී.

ඖෂධ සැපයීමට සිදුවිය හැකි බාධා, ඉල්ලුමේ ඇතිවිය හැකි සැලකියුතු වෙනස්කම් හේතුවෙන් කාරක ප්‍රාග්ධනයට ඇතිවන බලපෑමත්, එමඟින් ද්‍රවශීලතාවයට වන බලපෑමත් ඒ හේතුවෙන් මෙහෙයුම් දිගින් දිගටම පවත්වා ගෙන යාමට සිදුවන බලපෑමත් ආදී වශයෙන්වූ පුළුල් පරාසයක සාධක ඇගයීමෙන් පසු අපේක්ෂා කළහැකි අනාගත කාළයක් සඳහා මෙහෙයුම් පවත්වා ගෙනයාමට සංස්ථාව සතුව ප්‍රමානවත් සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වූ අතර දිගින් දිගට පවත්වා ගෙනයාමේ පදනමට අනුව මූල්‍ය වාර්තා පිළියල කර ඉදිරිපත් කිරීමට තීරණය කෙරිණි.

ඉහත සලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන නිර්ණය කිරීමේදී COVID 19 වසංගතයේ බලපෑම වාර්තා කරන දිනය තෙක් සලකා බලා ඇති අතර අදාල නිශ්චිත කරුණු සටහන් යටතේ අනාවරණය කර ඇත.

### 3.3. වසර තුල නිකුත් කරනු ලැබූ නව ගණකාධිකරන ප්‍රමිත/ දැනට පවතින ගණකාධිකරන ප්‍රමිත වල සිදුවූ වෙනස්කම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නව ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කර නොමැත. පහතින් දක්වා ඇති ශ්‍රීලංකා ගිණුමකරණ ප්‍රමිතීන් සඳහා 2022 ජනවාරි 1 වන දිනට පසු බලපැවත්වූ සංශෝධන මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු බලපෑමක් සිදුනොකරයි.

- විශාල කොන්ත්‍රාත්තු - ( IAS 37 සඳහා වෙනස්කම්)
- IASB විසින් නිකුත්කළ IFRS ප්‍රමිත සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම 2018–2020”
- දේපළ පිරියත හා උපකරණ — (IAS 16 සඳහා වෙනස්කම්)

### 3.4. දේපල, පිරියත හා උපකරණ

#### 3.4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ හඳුනා ගනු ලබන්නේ අදාල වත්කම හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව තුලට ගලා එන්නේ නම් හා වත්කමේ පිරිවැය නිශ්චිතව ගණනය කළ හැකි නම් පමණි.

#### 3.4.2. මිණුම් පදනම

ගෘහභාණ්ඩ, උපකරණ හා පරිගණක හැර දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත **ක්ෂය** හා සමුච්චිත හානි වටිනාකම් ඇත්නම් ඒවා ද අඩුකල පසු පිරිවැයට වේ. එබඳු පිරිවැය අගයන්ට දේපල, පිරියත හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් වූ උපාංග ප්‍රතිස්ථාපන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැයද ඇතුලත් වේ.

යම් නියමිත කාලයකට වරක් දේපල, පිරියත සහ උපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේනම්, අදාල ඉවත් කරනු ලබන කොටසට අදාල වටිනාකම ඉවත් කරන අතර නව කොටස එහි ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය සමඟින් පිරිවැයට එකතු කරයි. එලෙසම, ප්‍රධාන පරීක්ෂාවක් සිදුකරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරාලන්නේ නම්, ප්‍රතිස්ථාපන පිරිවැයක් වශයෙන් දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගැනේ. අනෙකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම් ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ. ලීබඩු, පරිගණක හා උපකරණ සාධාරණ වටිනාකමට නිර්ණය කර දක්වයි. ප්‍රත්‍යාගණන වත්කම් වල වෙළඳ වටිනාකම හා පොත් අගය අතර ප්‍රමාණාත්මක වෙනසක් නොමැතිබව සහතික කර ගැනීම සඳහා නිරන්තරයෙන් වත්කම් ප්‍රත්‍යාගණන කරයි. කිසියම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වාර්තා වුවහොත් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හා ස්කන්ධ ප්‍රාග්ධනයෙහි වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කර දක්වයි.

#### 3.4.3. ක්ෂය කිරීම

යන්ත්‍ර පිරියත හා උපකරණ අයිතමයන්ගේ ඇස්තමේන්තු ගත ඵලදායී ජීවිත කාලය තුල සරල මාර්ග ක්‍රමයට වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව පිළිබිඹු වන පරිදි ලාභා ලාභ ගිණුමේ දී **ක්ෂය** හඳුනා ගනියි.

දේපළ, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | වසර 20- 40 | පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 8 |
| රථ වාහන | වසර 3 සිට 17 | බයිසිකල් | වසර 6 සිට 7 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 10 | පරිගණක | වසර 4 |
| උපකරණ | වසර 5 | | |

වත්කම ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතා කිරීම ආරම්භ කල දින සිට වන අතර වත්කම විකිණීමට ඇති වත්කමක් ලෙස නම් කල දින හෝ ඉවත කල දින අතරින් ප්‍රථම යෙන් පැමිණෙන දින සිට නවතා දමයි. වත්කමක සුන්බුන් අගය හා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර යෝග්‍ය නම් වසර අවසානයේ දී LKAS 8 ට අනුව ගැලපීම් සිදුකරයි.

#### 3.4.4. හඳුනා නොගැනීම

යන්ත්‍ර පිරියත හා උපකරණ වල අයිතමයක් හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ අදාල වත්කමෙන් බලපොරොත්තු වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැතිවූ විට හෝ ඉවත්වූ විට හෝ වත්කම ඉවත් කල විට වේ. වත්කම ඉවත් කිරීමේ ලාභය හෝ අලාභය, යන්ත්‍ර පිරියත හා උපකරණ විකුණුම් මිල හා පොත් අගය සංසන්දනය කර ගණනය කරන අතර ලාභ හෝ අලාභ වෙනත් ආදායම් යටතේ දක්වයි.

#### 3.4.5. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

රජයේ නියෝග ඇඩීව පිළිපදිමින් හා සහාය දක්වමින් විකල්ප ක්‍රමවේද හරහා සංස්ථාව සිය මෙහෙයුම් දිගටම ක්‍රියාත්මක කරයි. දේපල, පිරියත හා උපකරණ ඌන උපයෝජනයක් සිදුවී නොමැත. COVID-19 වසංගතය ආශ්‍රිත අවධානම අවම කරගන්නා අතරම මෙහෙයුම් කටයුතු දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් හා ව්‍යාපාරික සැලසුම් ඇති බව කළමනාකාරිත්වය විශ්වාස කරන අතර වාර්තා කරන දිනට දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමේ අඩුවීමක් (***impairment***) අවශ්‍ය නොවන බව නිගමනය කරන ලදී.

### 3.5 නොනිමි වැඩ- ප්‍රාග්ධනය

ප්‍රවර්ථන වර්ෂයේ දී දරා ඇති එහෙත් ශේෂපත්‍ර දින දී ප්‍රාග්ධනිත නොකල ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇති අතර ප්‍රවර්ථන වර්ෂයේ දී ප්‍රාග්ධනිත ගත කර ප්‍රයෝජනයට ගන්නා ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

### 3.6. අස්පෘශ්‍ය වත්කම්

**අත්පත් කර ගන්නා** අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වශයෙන් සළකනු ලබන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙනයන අගය තීරණය කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රම**ක්ෂය** හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කරමිනි. ප්‍රාග්ධන සංවර්ධන වියදම් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධන ගත කරනු නොලබන අතර අදාල වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල දරා ඇති වියදම දක්වනු ලැබේ.

සංස්ථාවේ අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ඒවායේ තක්සේරු කල එලදායී ජීවිත කාලය තුල සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් ක්‍රම**ක්ෂය** කරයි.

### 3.7 කල්බදු

කල්බදු වත්කම් සංස්ථාවේ භාවිතයට පැවති දින සිට කල්බදු භාවිත අයිතිය සහිත වත්කම් හා ඒවාට අනුරූප වගකීම් ලෙස හඳුනා ගනියි. සංස්ථාවට ඔසුසල ගොඩනැගිලි, ගබඩා පහසුකම් හා සමහර තොරතුරු තාක්ෂණ උපකරණ සඳහා කල්බදු පවතී. කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකම් සහිත කල්බදු හැර සෑම කල්බද්දක්ම ශේෂපත්‍රයේ භාවිත අයිතිය සහිත වත්කම් හා කල්බදු වගකීම් ලෙස දක්වා ඇත.

### (අ) භාවිත අයිතිය සහිත වත්කම්

පහත දත්ත පදනම් කරගත් පිරිවැය මත භාවිත අයිතිය සහිත වත්කම් ආරම්භයේදී ගණනය කරයි.

- කල්බදු වගකීම් වල මූලික ඇගයීමේ වටිනාකම
- ආරම්භක දිනයේ දී හෝ ඊට පෙර කරන ලද බදු ගෙවීම් වලින් ලැබී ඇති බදු දිරි දීමනා අඩුකල පසු වටිනාකම
- කවර හෝ ආරම්භක පිරිවැයක්, හා
- ඉවත්කිරීම් හෝ ප්‍රතිෂ්ඨාපන පිරිවැයක්.

භාවිත අයිතිය සහිත වත්කම් වල පසු අගය ගණනය කරනු ලබන්නේ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අගය අඩුවීම් ඇත්නම් අඩුකල පසුවේ. භාවිත අයිතිය සහිත වත්කම් වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය හා බදු කාල සීමාව අතරින් වඩා කෙටි කාලය තුල සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

### (ආ) කල්බදු වගකීම්

SLFRS 16 ප්‍රමිතයේ විධිවිධානයන්ට අනුව, කල්බදු වගකීම් හඳුනා ගෙන වටිනාකම ගණනය කරනු ලබන්නේ, බදුකරුගේ වර්ධක ණය අනුපාතයට ඉතිරි කල්බදු ගෙවීම් වට්ටම් කිරීමෙනි. එය සමාන නියමයන්, කොන්දේසි හා සමාන ආරක්ෂක ඇපයක් සහිත සමාන ආර්ථික පරිසරයක් තුල භාවිතා අයිතිය සහිත වත්කමට සමාන වත්කමක් ලබාගැනීමට අරමුදල් ලබා ගැනීමේ දී ණය ගෙවීමට බදු ගැනුම්කරු විසින් දැරිය යුතු පොලී අනුපාතයවේ.

සංස්ථාව කල්බදු වගකීම ශේෂපත්‍රයේ වෙනමම අයිතමයක් ලෙස දක්වන අතර කල්බදු වගකීම මත වූ පොලී වියදම මූල්‍ය වියදම් යටතේ විස්තීර්ණ ආධායම් ප්‍රකාශයේ දක්වනු ලබයි.

### (ඇ) කල්බදු වගකීම් නැවත මැනීම

දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳාපවතින විචල්‍ය කල්බදු ගෙවීම්වල අනාගත වැඩිවීම් වලට සංස්ථාව නිරාවරණය වන නමුත් එම වැඩිවීම් ක්‍රියාත්මකවන තුරු කල්බදු වගකීම් වලට ඇතුලත් කර නොගනී. දර්ශකයක් හෝ අනුපාතයක් මත සිදුවන කල්බදු ගෙවීම් සඳහා ගැලපීම් සිදුකරන විට කල්බදු වගකීම නැවත ගණනය කර භාවිත අයිතිය සහිත වත්කම් වලට එරෙහිව ගලපනු ලබයි.

### (ඈ) වගකීම් ලෙස හඳුනා නොගත් කල්බදු ගෙවීම්

කෙටිකාලින කල්බදු (බදුකාලය මාස 12ක් හෝ එයට අඩු) හා අඩු වටිනාකම් සහිත කල්බදු, කල්බදු වගකීම් ලෙස හඳුනා නොගැනීමට තීරණය කරනලදී. එවැනි කල්බදු වෙනුවෙන් සිදුකරනු ලබන ගෙවීම්, සරල මාර්ග ක්‍රමයට වියදමට ගලපනු ලබයි. මීට අමතරව, ඇතැම් විචල්‍ය කල්බදු ගෙවීම් කල්බදු වගකීම් ලෙස පිළිගැනීමට අවසර නොදෙන අතර ඒවා වියදම් ලෙස ගිණුම් ගතකරයි

### 3.8. බදුකරණය

#### 3.8.1 වර්තමාන බදුකරණය

වර්තමාන බදු වත්කම් හා බදු වගකීම් වනුයේ බදු බලධාරීන්ට ප්‍රවර්ථන වර්ෂය හා අතීත වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු වන හා ඔවුන්ගෙන් අයකර ගතයුතු වන වටිනාකම් වේ. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂපත්‍ර දින වන විට බලාත්මකව පවතින ඒවා වේ. ඒ අනුව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා එයට කරන ලද සංශෝධන වල විධිවිධාන වලට අනුකූලව හා පනතේ නියම කර ඇති අනුපාතයනට අනුව බදු ගෙවීමේ කාර්‍යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගෙන බදු ප්‍රතිපාදනය කර ඇත. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

#### 3.8.2. විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හඳුනාගෙන ඇති සෑම වර්ගයකම තාවකාලික වෙනස්කම්, විලම්බිත බදු වත්කම් හා බැරකම් ගණනය සඳහා සලකා බලා ඇත. මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම්, විශ්‍රාම පාරිතෝෂිකය සඳහා වූ ප්‍රතිපාදනය, ණයගැති අගය අඩුවීම හා මතබේදාත්මක තොග සඳහා වෙන්කිරීම් විලම්බිත බදු ගණනය සඳහා සලකා බලා ඇත. සංස්ථාවේ විලම්බිත වත්කම් හා බැරකම් ආදායම් බදු අනුපාතය අනුව ගණනය කර දක්වයි.

විලම්බිත බදු වත්කම් වල පොත් අගය සෑම වාර්තා කරන වර්ෂයක් අවසානයේම සමාලෝචනය කර බදු අයකල හැකි ලාභයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමානවත් මට්ටමට අඩුකර දක්වයි. COVID-19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත බදු වියදම් අඩු වීමට ප්‍රතිචාර ලෙස විලම්බිත බදු වත්කම් වල ගැලපීම් අවශ්‍ය නොවන බව කළමනාකාරිත්වය තීරණය කර ඇත.

### 3.9. භාණ්ඩ තොග

සංස්ථාවේ භාණ්ඩ තොග වටිනාකම් ගණනය කරනු ලබන්නේ කල් ඉකුත්වූ හා විකිණිය නොහැකි භාණ්ඩ සඳහා නිසි වෙන්කිරීම් කල පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මතවේ. ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු පදනමට අනුව තොග තක්සේරු කරයි. (FIFO)

#### 3.9.1. තොග අගය කිරීම

**තොග පිරිවැය- ජීවනී ඒකකය**

**අමුද්‍රව්‍ය තොගය - ජීවනී ඒකකය**

අමතර වියදම්ද ඇතුලත්ව මිලදී ගැනීමේ පිරිවැයට

**නොනිමි වැඩ**

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

**නිමි භාණ්ඩ**

සම්පූර්ණ අමුද්‍රව්‍ය පිරිවැය හා විචල්‍ය නිෂ්පාදන වියදම

### 3.10. මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ වලට අයත් වන්නේ අතැති මුදල් හා බැංකු මුදල්, භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන, මාස දොලහක් හෝ අඩු කාලයක් තුල කල්පිරෙන ද්‍රවශීල තාවයෙන් ඉහල ආයෝජනයි. බැංකු අයිරාව ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත.

### 3.11. පර්යේෂණ වියදම්

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණෙන් සිදුකරන පර්යේෂණ කටයුතු සඳහා වූ වියදම් එම වියදම් ඇතිවූ අවස්ථාවේදීම ලාභයට ගලපනු ලබයි.

## 4. බැරකම් හා ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

### 4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සේවකයෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සඳහා බැරකමක් පැන නගින්නේ සේවකයෙකු සංස්ථාව සමඟ අවුරුදු පහක අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන අවස්ථාවේදිය. ශේෂපත්‍රයේ පෙන්නුම් කරන මෙම වගකීම ශේෂපත්‍ර දිනයේදී ප්‍රක්ෂිප්ත ඒකක බැර ක්‍රමයට අනුව (Projected Unit Credit Method) තක්සේරු කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. මෙම විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා භාහිර අරමුදලක් ඇතිකර නොමැත.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාලව තක්සේරු වන සියලු ආයුගණක ලාභ හා අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වහාම ගිණුම්ගත කිරීමට සංස්ථාව කටයුතු කරයි.

වෘත්තිය ආයුගණක තක්සේරුකාර සමාගමක් වන Actuarial and Management Consultants (Pvt) Ltd ආයතනයේ එම්. පූපාලනාදන් මහතා විසින් 2021 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුව සිදු කරන ලදී. විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව ගණනය කිරීමේදී පදනම් කරගත් උපකල්පන හා දත්ත මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 26 යටතේ දක්වා ඇත.

### 4.1.2. නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සේවකයන් වෙනුවෙන් ලබාදෙන දායකත්වයන් අදාල අරමුදල් රෙගුලාසි වලට අනුකූලව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකර අරමුදලට සැපයෙන දායකත්වයන් ආදායම් ප්‍රකාශය තුල වියදමක් වශයෙන් හඳුනා ගනු ලැබේ.

**සේවක අර්ථසාධක අරමුදල**

පිළිවෙලින් සංස්ථාව හා සේවකයන් ගමන් වියදම් දීමනා හැර දළ වැටුපෙන් 12% ක් හා 10% ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයයි.

**සේවක භාරකාර අරමුදල**

සංස්ථාව ගමන් වියදම් දීමනා හැර දළ සේවක වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකත්වය සපයයි.

## 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී කාර්යානුගත වියදම් ක්‍රමය යොදාගෙන ඇත්තේ එමඟින් සංස්ථාවේ කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණව නිරූපනය වන බැවිනි.

### 5.1. ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFRS 15- ගනුදෙනු කරුවන් සමඟ ගිවිසුම් ගත ආදායම් ප්‍රමිතයේ පියවර පහ ප්‍රවේශයට අනුව සංස්ථාව ආදායම් හඳුනා ගැනීම හා නිර්ණය කිරීම සිදුකරයි. තෙවන පාර්ශවයන් වෙනුවෙන් රැස්කළ වටිනාකම් හැර ගනුදෙනුකරු සමඟ ගිවිසුමේ නිරූපිත ප්‍රතිෂ්ඨාව පදනම් කරගෙන සංස්ථාව සිය ආදායම නිර්ණය කරයි. සංස්ථාව ආදායම් හඳුනා ගන්නේ කාර්‍යසාධන බැඳීම් පිළිබඳ සෑහීමට පත්වන්නේ නම් පමණි.

සංසන්දනාත්මක කාලපරිච්ඡේදයේදී, ආර්ථික ප්‍රතිලාභය සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව නිශ්චිත ආදායම් හා ඊට සම්බන්ධ පිරිවැය නිවැරදිව ගණනය කළහැකි ආදායම් ගෙවීම් කර ඇති නැති බව නොසලකා උපචිත පදනමට හඳුනා ගන්නා ලදී. ගිවිසුම් ගතව නිර්වචනය කරන ලද ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබියයුතු ප්‍රතිෂ්ඨාවේ සධාරණ වටිනාකමට ආදායම ලෙස ගණනය කරනු ලබයි.

### 5.1.1 භාණ්ඩ හා සේවාවල ස්වභාවය

සංස්ථාව තම ආදායම් ජනනය කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් වලට අදාල ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිපත්ති පහතින් දැක්වේ.

**i. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය හා වෙළඳාම මඟින් ලද ආදායම්**

සංස්ථාව පහත ප්‍රභවයන් ගෙන් ආදායම් හඳුනා ගනියි;

| ගනුදෙනුකරු | ස්වාභාවය,කාර්යසාධන බැඳීම පිළිබඳ තෘප්තිමත්බවට කාලය හා වැදගත් වන ගෙවීම් කොන්දේසි |
|---|---|
| **බෙදාහරින්නන්/වරලත් වෙළඳුන්** | සංස්ථාව ආදායම හඳුනාගන්නේ මාසිකව, ගනුදෙනුකරු භාණ්ඩ තම භාරයට ලබාගත් මොහොතේ දීය. සංස්ථාව විසින් මිල තීරණය කර බෙදාහරින්නන් වෙත අලෙවිකරන අතර මිලගනන් විටින් විට බෙදාහරින්නන් වෙත දැනුම් දෙනු ලබයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් බෙදාහරින්නන්ට නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් බෙදාහරින්නන්ට අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.<br><br>ගනුදෙනු කරුවන් විසින් මුලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට සමාන අවලංගු කල නොහැකි කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබාදිය යුතුවේ. බැංකු ඇපකරය ගිවිසුම් කාලය ආරම්භයේ සිට ගිවිසුම් කාලය පුරා බලාත්මකව තිබිය යුතුවේ. |
| රජයේ හමුදාවන්/රජයේ රෝහල්/පුද්ගලික රෝහල් | සංස්ථාව ආදායම හඳුනා ගන්නේ මාසිකව, ගනුදෙනු කරුවන්ට භාණ්ඩ භාරදුන් අවස්ථාවේදී වේ. සංස්ථාව විසින් තීරණය කර ගනුදෙනු කරුවන්ට විටින්විට දැනුම් දෙනු ලබන මිලකට පාරිභෝගිකයින් වෙත භාණ්ඩ අලෙවිකරයි.<br><br>නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි. |

**ii. වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම සැපයීමෙන් ලද ආදායම්**

වෛද්‍ය සේවා දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලබාදුන් අවස්ථාවේදී ආදායම හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

**iii. ඖෂධ හා සෞඛ්‍ය ආරක්ෂිත අයිතම නිෂ්පාදනය**

ඖෂධ සංස්ථාව පහත ඖෂධ වර්ග නිෂ්පාදනය කර අලෙවි කරයි,

- ජීවනී
- ග්ලූකෝස්
- බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම්

භාණ්ඩ ගනුදෙනු කරුවන්ට භාරදුන් අවස්ථාවේදී නිෂ්පාදිත භාණ්ඩ විකුණුම් ලෙස හඳුනා ගනියි. නිකුත් කරනු ලබන අවස්ථාවේ නරක්වී, අවපැහැගැන්වී හෝ අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත් වුවහොත් හැර සංස්ථාව විසින් අලෙවිකල භාණ්ඩ නැවත භාරගැනීම හෝ වෙනත් භාණ්ඩයකට හුවමාරු කිරීම සිදු නොකරයි.

ආදායම හඳුනා ගැනීමේදී සංස්ථාව පහත විශේෂිත නිර්ණායකයන් ද සලකා බලයි.

### 5.1.2 ආපසු එවීමේ හිමිකම සහිත විකුණුම්

සංස්ථාව විසින් ආපසු එවීමේ හිමිකම සහිතව භාණ්ඩයේ පාලනය ගනුදෙනුකරුට ලබා දෙනුයේ,

- විකුණනු ලබන භාණ්ඩය කල් ඉකුත් වීමට ආසන්න වී ඇති විට
- නිකුත් කරනු ලබන අවස්ථාවේ භාණ්ඩය නරක්වී හෝ අව පැහැගැන්වී තිබූ විට
- අත්වැරදීමකින් වැරදි අයිතමයක් නිකුත්වූ විට.

ආපසු එවීමේ හිමිකම සහිතව විකුණූ භාණ්ඩ සංස්ථාව විසින් පහත පරිදි හඳුනා ගනියි.

- සංස්ථාව හිමිකම් ලැබීමට අපේක්ෂා කළ වටිනාකමට මාරුකළ අයිතමයේ ආදායම
- ආපසු ගෙවීමේ වගකීම; හා
- වත්කමක් (එයට අනුරූප විකුණුම් පිරිවැය ගැලපීම) සඳහා මුදල් ආපසු ගෙවීමේ වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගේ භාණ්ඩ ආපසු ලබා ගැනීම

එක් එක් වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානයේදී, මාරු කරන ලද භාණ්ඩ සඳහා හුවමාරු වශයෙන් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන මුදල් තක්සේරු කිරීම සංස්ථාව විසින් යාවත් කාලීන කළ යුතු අතර අවශ්‍ය වූ විට ගනුදෙනු මිලට අනුරූප වෙනසක් සිදුකරයි.
මුදල් ආපසු ගෙවීමේ ප්‍රමාණයන් පිළිබඳ අපේක්ෂා වෙනස් වීම් සඳහා සංස්ථාව එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ මුදල් ආපසු ගෙවීමේ වගකීම යාවත්කාලීන කල යුතුය. අනුරූප ගැලපීම සංස්ථාවේ ආදායම (හෝ ආදායමේ අඩුවීමක්) ලෙස හඳුනා ගනියි.

මුදල් ආපසු ගෙවීමෙන් වගකීම පියවීම මත ගනුදෙනු කරුවන්ගෙන් භාණ්ඩ ලබාගැනීමට සංස්ථාව හඳුනාගෙන ඇති වත්කමක් මුලින් ගණනය කරනු ලබන්නේ එම භාණ්ඩයේ ශුද්ධ අගයෙන් භාණ්ඩය ආපසු ගැනීම සඳහා අපේක්ෂිත පිරිවැයක් ඇත්නම් අඩු කිරීමෙනි. එක් එක් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේ දී, ආපසු ලැබිය හැකි භාණ්ඩ පිළිබඳ අපේක්ෂාවන් හි වෙනස්වීම් හේතුවෙන් පැනනඟින වත්කම් ඇගයීම සංස්ථාව යාවත් කාලීන කළ යුතුය.

## 5.2 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම අනුව හඳුනාගනියි.

## 5.3 සැපයුම් කරුවන්ගෙන් ලැබිය යුතු වන්දි

අතිරේක ගබඩා ගාස්තු, ඩෙමරේජ් ගාස්තු, හිඟ සැපයුම් සහ තොග හානි වෙනුවෙන් අයවිය යුතු හිමිකම් ඒවායේ අවිනිශ්චිත භාවය නිසා මූල්‍ය ප්‍රකාශයන්හි සැලකිල්ලට ගෙන නොමැත. නමුත් ආදායම උපලබ්ධි වන බව නිශ්චිතව දන්නා විට එම හිමිකම් මූල්‍ය ප්‍රකශන වල ඇතුලත් කර ඇත. 2021 වසර අවසානයේ දී ලැබියයුතු වන්දි වටිනාකම රු. මිලියන 1984.2 ක් විය. (2017.01.01 සිට 2021.12.31 දක්වා කාලපරිච්ඡේදයට අදාලව)

## 5.4. වියදම්

ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇතිවූ සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායමෙන් අඩුකර ඇත. අලුත් වැඩියාවන් හා අලුත් කිරීම් එම වියදම ඇතිවූ වර්ෂයේ ලාභයට ගලපයි.

### 5.4.1. **මූල්‍ය වියදම්**

ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම්, අත්පත්කර ගැනීම, ගොඩනැඟීම, නිෂ්පාදනය වෙනුවෙන් කෙලින්ම අදාලවන ණය පිරිවැය, අදාල වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධන ගත කරයි. අනෙක් සියලුම ණය පිරිවැයන් පිරිවැය දරන ලද වර්ෂයේ වියදම් ලෙස සලකනු ලබයි. සංස්ථාවේ මූල්‍ය වියදම් තුල බැංකු අයිරාපොලී, ණයවර ලිපි විවෘත්ත කිරීමේ වියදම් සහ ණය ගිවිසුම් ගාස්තු ඇතුලත් වේ.

### 5.4.2. **පොදුකාර්ය වියදම් බෙදා වෙන්කිරීම**

රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ රජයේ බෙහෙත් ගබඩාවට සම්බන්ධ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කර ගොඩනගාගත් ප්‍රතිශතයන් අනුව පොදුකාර්ය පිරිවැය බෙදා වෙන්කර දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනයේ පොදුකාර්ය වියදම් බෙදා ඇති ආකාරය පහත දැක්වේ.

| | ර.බෙ.ග. | රා.ඖ.ස. |
|---|---|---|
| (අ) සේවක වේතන | 56% | 44% |
| (ආ) ගමන් වියදම් | 10% | 90% |
| (ඇ) සැපයුම් හා අවශ්‍යතා ` | 25% | 75% |
| (ඈ) අලුත්වැඩියා හා නඩත්තු | 50% | 50% |
| (ඉ) ප්‍රවාහන,සන්නිවේදන,<br>- උපයෝගීතා හා වෙනත් සේවා | 50% | 50% |
| (ඊ) පර්යේෂණ වියදම් | 65% | 35% |
| (උ) බැංකු අයිරා පොලී | (සත්‍ය වියදම) | (සත්‍ය වියදම) |

## 6 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම සහ පසු අගය කිරීම

### 6.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගනු ලබන්නේ අස්ථිත්වය සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදන වලට පාර්ශව කරුවෙකු වූ අවස්ථාවේදීය. සාමාන්‍ය පරිදි මූල්‍ය වත්කම් මිලදී ගැනීම හා විකිණීම හඳුනා ගන්නේ හුවමාරු දිනයේ දී එනම් සංස්ථාව වත්කම විකිණීමට හෝ මිලදී ගැනීමට බැඳී සිටින දිනකදීය.

මූලික හඳුනා ගැනීමේදී, සංස්ථාව මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එහි සාධාරණ වටිනාකමට ගණනය කර ගලපයි මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නොවන විට, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත්කර ගැනීම හෝ නිකුත් කිරීම වෙනුවෙන් වැඩිවූ හා සෘජුවම අදාලවන ගනුදෙනු පිරිවැයට හඳුනා ගනියි.

#### 6.1.1 මූල්‍ය වත්කම්

##### 6.1.1.1 වර්ගීකරණය හා පසු තක්සේරුව

සංස්ථාව පහත මිනුම් කාණ්ඩ යටතේ මූල්‍ය වත්කම් වර්ග කර ඇත.

- ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVPL)
- වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට (FVOCI) හෝ:
- ක්‍රමක්ෂය පිරිවැය

ණය හා ප්‍රාග්ධන උපකරණ වර්ගීකරණයේ අවශ්‍යතා පහතින් විස්තර කර ඇත;

- **ණය මෙවලම්**

ණය මෙවලම් යනු නිකුත් කරනු ලබන්නාගේ දෘෂ්ටිකෝණයෙන් බලනවිට මූල්‍ය වගකීමක් ලෙස නිර්වචනය කල හැකි මෙවලම් වේ. ණය මෙවලම් වල වර්ගීකරණය හා පසු තක්සේරුව පහත කරුණු මත රඳා පවතී:

අ. වත්කම කළමනාකරණය සඳහා වන සංස්ථාවේ ව්‍යාපාරික ආකෘතිය හා:

ආ. වත්කමේ මුදල් ප්‍රවාහයේ ලක්ෂණ

මෙම කරුණු පදනම්ව, සංස්ථාව තම ණය මෙවලම් පහත සඳහන් මිණුම් කාණ්ඩ තුනට වර්ගීකරණය කර දක්වයි**:**

###### 6.1.1.1.1 ක්‍රමක්ෂේපිත පිරිවැය

ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීම සඳහා තබාගන්නා මුදල් ගලාඒම මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන **(SPPI)** හා ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට **(FVPL)** දැක්වීමට නියම කර නොමැති, වත්කම් ක්‍රමක්ෂේපිත පිරිවැයට දක්වනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලද පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ දක්වනු ලැබේ. අතැති මුදල් හා බැංකු මුදල් සේවක ණය,වෙළඳ ණයගැතියෝ හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සංස්ථාව මෙම වර්ගීකරණය යටතේ දක්වයි.

###### 6.1.1.1.2 වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVOCI)

මුදල් ගලා ඒමේදී මුල් මුදල හා පොලිය පමණක් නියෝජනය වන ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම (FVPL) දැක්වීමට නියම කර නොමැති, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය රැස්කිරීමට හෝ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ වටිනාකමට නිර්ණය කර දක්වයි. (FVOCI) මූල්‍ය වත්කම් හානිකරන ලාභ හෝ අලාභ හඳුනා ගැනීම් ද, මූල්‍ය සාධන පත්‍ර ක්‍රමක්ෂේපිත පිරිවැය මත පොලී ආදායම හා ලාභාලාභ ගිණුමෙහි හඳුනාගත් විදේශ මුදල් හුවමාරු ලාභ හෝ අලාභ ද හැර ධාරණ අගයෙහි විචලනයන් විස්තීරණ ආදායම් ගිණුමෙහි ගලපයි. මූල්‍ය වත්කමක් හඳුනා ගැනීමෙන් බැහැර කරන විට, කළින් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා හඳුනා ගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධය වෙනස්වීමේ සිට ලාභ හෝ අලාභ ලෙස වර්ග කර ලාභාලාභ ගිණුමට ගලපයි. මෙම මූල්‍ය වත්කම් වල පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස දක්වනු ලබයි. මෙම වර්ග කිරීම යටතේ ගැනෙන කිසිදු මූල්‍ය වත්කමක් දැනට සංස්ථාව සතුව නොමැත.

#### 6.1.1.1.3 ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල

ක්‍රමක්ෂේපිත පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ගිණුම හරහා සාධාරණ මිලට (FVOCI) යන නිර්ණායක වලට නොගැනෙන වත්කම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිල ක්‍රමයට අගය කරයි. හෙජින් ගිවිසුමක කොටසක් නොවන ණය ආයෝජනයක් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට පසු ගණනය කල විට පැන නගින ලාභය හෝ අලාභය කාල සීමාවට අදාල ලාභාලාභ ගිණුමේ ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගනියි. එය සාධාරණ මිලට නම් කරන ලද හෝ විකිණීම සඳහා නොවන ණය උපකරණයකින් පැන නගින්නක් නොවන්නේනම් ලාභාලාභ ප්‍රකාශයේ වෙනමම ඉදිරිපත් කරයි. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමයට අනුව ගණනය කර වෙනත් මෙහෙයුම් ආදායමට ඇතුලත් කරයි. දැනට සංස්ථාව සතුව මෙම කාණ්ඩය යටතට ගැනෙන කිසිදු වත්කමක් නොමැත.

- **ව්‍යාපාර ආකෘතිය**

මුදල් ප්‍රවාහය ජනනය කිරීම සඳහා සංස්ථාව වත්කම් කළමනාකරණය කරන ආකාරය ව්‍යාපාරික ආකෘතියෙන් පිළිබිඹුවේ. එනම් සංස්ථාවේ පරමාර්ථය තනිකරම වත්කම් වලින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය හා වත්කම විකිණීමෙන් පැනනගින ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය යන දෙකම සඳහා ද යන්නයි. එසේ නොවන විට ( උදා: විකිණීම අරමුණු කරගත් මූල්‍ය වත්කම්) එවිට මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියෙන් වෙනත් කොටසක් ලෙස වර්ගීකරණය කර ලභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට ගණනය කරනු ලබයි. වත්කම් සමූහයක් සඳහා ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීමේ දී සංස්ථාව වත්කම සඳහා මුදල් ප්‍රවාහය එකතු කරන ආකාරය පිළිබඳ පෙර අත්දැකීම්, වත්කම් වල ක්‍රියාකාරිත්වය අගයන ආකාරය හා ප්‍රධාන කළමනාකරිත්ව නිලධාරින්ට වාර්තා කරන ආකාරය, අවධානම් තක්සේරුකර කළමනාකරණය කරන්නේ කෙසේද, හා කළමනාකරුවන්ට හානිපූරණය කරන්නේ කෙසේද යන්න සලකා බලයි.

- **මුළු මුදල හා පොලිය පමණක් ගෙවීම ( SPPI)**

ව්‍යාපාර ආකෘතිය විසින්, ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබා ගැනීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය ලබාගැනීම හා විකිණීම සඳහා වත්කම් තබාගන්නා අවස්ථාවල දී සංස්ථාව විසින් මූල්‍ය උපකරණයේ මුදල් ප්‍රවාහය මුළු මුදල හා පොලිය පමණක් නියෝජනය කරන බවට තක්සේරු කරයි. (SPPI Test) මෙම තක්සේරු කිරීමේදී, සංස්ථාව විසින් ගිවිසුම් ගත මුදල් ප්‍රවාහය මූලික ණය දීමේ විධිවිධාන වලට අනුකූලද යන්න සලකා බලයි. උදා. පොලියට ඇතුලත් වන්නේ මුදල් වල කාල වටිනාකම, ණය අවධානම, වෙනත් මූලික ණය දීමේ අවධානම් හා මූලික ණය විධිවිධානයන්ට අනුව ලාභ ආන්තිකය පමණද. මූලික ණය විධිවිධානයන්ට නොගැලපෙන අවධානම් හෝ අස්ථාවරත්වයට නිරාවරණය වීම් ගිවිසුම් කොන්දේසි මඟින් හඳුන්වා දෙන විට අදාල මූලික වත්කම ලභාලාභ ගිණුම හරහා සධාරණ වටිනාකමට වර්ගීකරණය කර ගණනය කරණු ලබයි.

සංස්ථාව ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය වෙනස්වූ විට පමණි. නැවත වර්ගීකරණය සිදුවන්නේ වෙනස් වීමෙන් පසු පළමු වාර්තා කරන කාලපරිච්ඡේදයේ ආරම්භයේ සිටය. එවැනි වෙනස්කම් ඉතා කලාතුරකින් සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර සලකා බලන කාලය තුල එවැනි කිසිවක් සිදුවී නොමැත.

#### 6.1.1.2 වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට හා (FVOCI) ක්‍රමයට ඉදිරියට ගෙන එන ලද සංස්ථාවේ ණය උපකරණ වත්කම් වල අපේක්ෂිත ණය අලාභ (ECL) අනුව ඉදිරියට ගෙනයන පදනම තක්සේරු කරයි. එක් එක් වාර්තා කරන දිනයේදී එවැනි පාඩු සඳහා වෙන්කිරීමක් සිදුකරයි. අපේක්ෂිත ණය අලාභ (ECL) ඇගයීම පහත කරුණු මත වේ.

- සිදුවිය හැකි ප්‍රතිපල පරාසය තක්සේරු කළ අපක්ෂපාතී හා බරතැබූ සම්භාවිතා වටිනාකම
- මුදලේ කාල වටිනාකම: හා
- අතීත සිදුවීම්, වර්තමාන තත්ත්වයන් හා අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ පුරෝකථන අනවශ්‍ය පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව වාර්තා කරන දිනයේදී ලබාගත හැකි සාධාරණ හා සහාය තොරතුරු.

COVID 19 වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ වෙළඳ ණය හානිකරණය සඳහා වෙන්කිරීම ගණනයේදී සලකා බලන, 2021 දෙසැම්බර් 31 දිනට හිඟහිටීමේ සම්භාවිතාවය (Probability of Default), හිඟහිටීමේ අලාභ(LGD) හා ආර්ථික සාධක ගැලපීම් (EFA) එම වෙන්කිරීම් වටිනාකම සැලකියයුතු ලෙස වැඩිකර දැක්වීමට හේතුවිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද "COVID 19 වසංගතය: මූල්‍ය වාර්තාකරණයේ බලපෑම් පිළිබඳ මාර්ගෝපදේශ සටහන්" පදනම්ව මෙම හෙළිදරව්ව ඉදිරිපත්කර ඇත.

### 6.1.1.2.1 අපේක්ෂිත ණය පාඩු දීමනාව (ECL) ගණනය කිරීම

ක්‍රමක්ෂය පිරිවැයට හා FVOCI ක්‍රමයට ගණනය කරන මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනාව ගණනය කිරීම යනු සංකීර්ණ ආකෘතීන් භාවිතා කිරීම හා අනාගත ආර්ථික තත්ත්වයන් හා ණය හැසිරීම පිළිබඳ සැලකිය යුතු උපකල්පන අවශ්‍ය වන ක්ෂේත්‍රයකි. ( උදා: ගනුදෙනු කරුවන් පැහැරහැරීම හා එහි ප්‍රතිපල වශයෙන් ඇතිවන පාඩු ඇතිවිය හැකි බව) අපේක්ෂිත ණය පාඩු (ECL) ගණනය කිරීම සඳහා ගිණුම්කරණ අවශ්‍යතා ක්‍රියාවට නැංවීමේදී සැලකිය යුතු විනිශ්චයන් ගණනාවක් අවශ්‍යවේ.

- සැලකිය යුතු ලෙස ණය අවදානම වැඩි කරනු ලබන නිර්ණායක තීරණය කිරීම
- (ECL) ගණනය කිරීම සඳහා සුදුසු ආකෘතීන් හා උපකල්පන තෝරා ගැනීම
- සෑම වර්ගයකම භාණ්ඩ/වෙළඳපොළ හා ඒ ආශ්‍රිත ECL වෙනුවෙන් වූ අවස්ථා අගයකිරීම හා සාපේක්ෂ බර තැබීම් ප්‍රතිෂ්ඨාපනය: හා
- ECL ගණනය කිරීම සඳහා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩ පිහිටුවීම

ECL ගණනය කිරීම සඳහා සංස්ථාව විසින් ගන්නා ලද තීරණ හා ඇස්තමේන්තු කිරීම් පහත පරිදිවේ.

- අපේක්ෂිත ණය පාඩු යනු පැහැර හැරීමේ සම්භාවිතාව (PD) පැහැර හැරීම් මතවූ අලාභ (LGD) හා ආර්ථික සාධක ගැලපුම් (EFA) අඩුකල පසු අගයවේ. (PD) යනු ණයගැතියෙකු සිය මූල්‍ය වගකීම පැහැර හැරීමේ සම්භාවිතාවය, එනම් ඉදිරි මාස 12 තුල හෝ වගකීමේ ඉතිරි ජීවකාලය තුලවේ.

- පැහැර හැරීම් වලට අනාවරණය වීම තුලින් සංස්ථාව අපේක්ෂා කරන අලාභයේ ප්‍රමාණය LGD මඟින් නියෝජනය කරයි. LGD ගණනය කරනු ලබන්නේ ජීව කාලය පදනම් කරගෙන වන අතර ජීවකාලය තුල LGD යනු ණයෙහි ඉතිරි අපේක්ෂිත ජීව කාලය තුල පැහැර හැරීමක් සිදු වුවහොත් සිදුවීමට අපේක්ෂිත අලාභයේ ප්‍රතිශතය වේ.

- සංස්ථාව වසර අටක ආර්ථික දත්ත පදනම් කර ගනිමින් වසර 5ක් සඳහා ආර්ථික වර්ධනය පිළිබඳව පුරෝකථනය කර ඇති අතර සංස්ථාවේ වර්ධනයේ බලපෑම පිළිබඳ බර තැබූ සම්භාවිතාව භාවිතා කරමින් ආර්ථික සාධක ගැලපුම (EFA) පිළියල කරයි. ප්‍රධාන ගණුදෙනු කරුවන්ගේ ස්වභාවය හේතුවෙන් සංස්ථාවේ වර්ධනයට බලපාන ප්‍රධාන සාධකය ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය EFA ගණනය සඳහා යොදා ගනියි.

### 6.1.1.3 හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූල්‍ය වත්කම් හෝ එයින් කොටසක්, හඳුනා ගැනීමෙන් ඉවත් කරනුයේ වත්කම් වලින් මුදල් ප්‍රවාහය ලැබීමේ ගිවිසුම් කාලය අවසන් වූ විට, හෝ ඒවා මාරුකලවිට හෝ (1) සංස්ථාව තම හිමිකාරත්වයේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකියයුතු ලෙස මාරු කලවිට, හෝ (2) සංස්ථාව තම හිමිකාරත්වයේ හා වත්කමේ පාලනය කිරීමේ සියලූ අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරුකිරීම හෝ රඳවා ගැනීම නොකරන විට.
සංස්ථාව වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා ගිවිසුම් ගත අයිතිවාසිකම් රඳවා ගන්නා නමුත් එම මුදල් ප්‍රවාහයන් වෙනුවෙන් වූ ගිවිසුම් ගත බැදීම් වෙනත් ආයතන භාර ගන්නා විට හා සියලූ අවදානම් හා ප්‍රතිලාභ සැලකියටයුතු ලෙස මාරු කරන විට. මෙවැනි ගනුදෙනු "pass through" මාරු කිරීම් ලෙස සැලකෙන අතර ගණුදෙනු හඳුනා නොගැනෙන්නේ සංස්ථාව;

- වත්කම් වලින් සමාන මුදලක් එකතු කිරීම හැර ගෙවීම් කිරීමට බැදී නැති විටදී.
- වත්කම විකිණීමට හෝ ඇපයට තැබීම තහනම්; හා
- වෙනත් වත්කමකින් එකතු කරන යම් මුදලක් ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ප්‍රේෂණය කිරීමට බැදී ඇති විට.

### 6.1.2 මූල්‍ය වගකීම්

#### 6.1.2.1 වර්ගීකරණය හා පසු අගය කිරීම

ප්‍රවර්තන වර්ෂයේ හා පෙර වර්ෂවල, ලාභාලාභ ගිණුම හරහා සාධාරණ මිලට අගය කරන මූල්‍ය වගකීම් හැර අනෙක් මූල්‍ය වගකීම් වර්ගීකරණය හා පසු ඇගයීම ක්‍රමක්ෂය පිරිවැයට සිදුකරයි. මෙම වර්ගීකරණය ව්‍යුත්පන්න, විකිණීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා මූලික හඳුනා ගැනීමේදී නම් කරන ලද වෙනත් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

සාධාරණ මිලට ලාභාලාභ ගිණුම හරහා අගය කිරීමට නම් කරන ලද මූල්‍ය වගකීම් වලින් ජනනය වූ ලාභ හෝ අලාභ වලින් කොටසක් වෙනත් විස්තීරණ ආදායම් යටතේ දක්වයි. ( වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම් වලට හේතු වන මූල්‍ය වගකීම් වල සාධාරණ වටිනාකමේ වෙනස, එය වෙළඳපොල අවදානමට තුඩු දෙන වෙළඳපොල තත්ත්වයන් හා වෙනස්වීම් වලට ආරෝපනය නොවන් ප්‍රමාණය) ඉතිරි කොටස ලාභාලාභ ගිණුමේ දක්වයි. ( වගකීම් වල සාධාරණ වටිනාකමෙහි ඉතිරි වෙනස) මෙවැනි ඉදිරිපත් කිරීමක් මඟින් ගිණුම්කරණ නොගැලපීම් ඇතිවීම හෝ විශාල වීමක් සිදුනොවේ නම්, වගකීම් වල ණය අවදානමේ වෙනස්වීම් නිසා ඇතිවන වාසි හා අවාසි ද ලාභය හෝ අලාභය ලෙස ඉදිරිපත් කරනු ලැබේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වටිනාකම් හා බැංකු අයිරාව ඇතුලත් වේ.

### 6.1.2.2 හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

මූල්‍ය වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලබන්නේ එම වගකීම් අවසන්වූ විටය. ( උදා; ගිවිසුමෙහි සඳහන් කර ඇති කරුණු වලින් නිදහස්වූ විට, අවලංගුවූ විට හෝ අවසන්වූ විට වේ.)

## 6.2. ගණනය කිරීමේ ක්‍රම

### ක්‍රමක්ෂය පිරිවැය හා සඵල පොලී අනුපාතය

ක්‍රමක්ෂය පිරිවැය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් මූලිකව හඳුනා ගැනීමේදී ගණනය කර අඩු කරන මූලික ආපසු ගෙවීම් වටිනකමට, එකතු හෝ අඩු කල සඵල පොලී අනුපාතයට අනුව ගණනය කරන මූලික හඳුනා ගැනීමේ වටිනාකම හා කල්පිරීමේ වටිනාකම අතර වෙනසට මූල්‍ය වත්කම් වල අලාභ සඳහා වෙන්කිරීම් තිබේ නම් ගැලපූ අගයයි.

සඵල පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ඇස්තමේන්තුගත අනාගත කාලය සඳහා නිවැරදිව වට්ටම් කල මුදල් ගෙවීම් හෝ ලැබීම් සිට දළ වශයෙන් මූල්‍ය වත්කමක ඉදිරියට ගෙනආ අගයෙහි අනුපාතයවේ. ( එනම් කිසියම් හානිකරණ දීමනාවක් ඇත්නම් එය ගැලපීමට පෙර ක්‍රමක්ෂය පිරිවැය) හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 7 ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **ආදායම - රා.ඖ.ස.** | | | |
| තොග වෙළඳාම | | 2,952,076,633 | 2,981,077,812 |
| ජීවනී වෙළඳාම | | 159,003,516 | 134,564,549 |
| ඔසුසල වෙළඳාම ( සටහන 30) | | 6,270,536,152 | 5,615,646,408 |
| නොඉපයූ ලාභ සඳහා වෙන්කිරීම් | | (9,068,148) | (1,125,679) |
| ණය රක්ෂණ යෝජනා ක්‍රමය | | 2,850,703 | 2,880,235 |
| සැපයුම් කරුවන්ගෙන් අයවූ වන්දි | | 71,423,261 | 65,003,766 |
| **එකතුව** | | **9,446,822,118** | **8,798,047,091** |
| **ආදායම - ර.බෙ.ග.** | | | |
| ආනයනික සැපයුම් | | 24,299,943,685 | 29,313,911,102 |
| දේශීය සැපයුම් | | 29,156,290,884 | 18,510,516,508 , |
| එන්නත් ආනයනය කිරීම ( සටහන 7.1) | | 13,887,481,786 | - |
| ම.ම්.ගැ.ඒකකය හරහා සැපයුම් | | 2,765,069,155 | 5,952,835,591 |
| සැපයුම් කරුවන්ගෙන් අයවූ වන්දි | | 570,472,023 | 398,088,092 |
| ප්‍රමාදවී සැපයුම් මත දඩ | | 132,086,976 | 148,213,322 |
| **එකතුව** | | **70,811,344,509** | **54,323,564,615** |
| | | | |
| **මුළු ආදායම** | | **80,258,166,627** | **63,121,611,706** |

## 7.1 සංස්ථාව විසින් කොවිඩ් 19 එන්නත් ආනයනය කර සැපයීම

| එන්නත් වර්ගය | පිරිවැය හා ප්‍රවාහන ගාස්තු<br>රු. | සේවා ගාස්තුව (4%)<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|
| **එන්නත් ආනයනය රජයේ අරමුදල් මඟින්** | | | |
| ආනයන හැසිරවීම සඳහා සේවාගාස්තු | | | |
| සයිනොෆාම් එන්නත් (Sinopharm ) | - | 1,128,184,292 | 1,128,184,292 |
| ෆයිසර් එන්නත් (Pfizer) | - | 129,131,934 | 129,131,934 |
| | **-** | **1,257,316,226** | **1,257,316,226** |
| **එන්නත් ආනයනය රා.ඖ.ස. අරමුදල් මඟින්** | | | |
| සයිනොෆාම් එන්නත් (Sinopharm ) | 10,957,247,800 | 438,289,912 | 11,395,537,713 |
| ස්පුට්නික් වී එන්නත් (Sputnik V) | 665,869,661 | 26,634,786 | 692,504,447 |
| කොවිඩ් ෂිල්ඩ් එන්නත් (Covidshield) | 521,272,500 | 20,850,900 | 542,123,400 |
| එකතුව | **12,144,389,961** | **485,775,598** | **12,630,165,560** |
| **එකතුව** | **12,144,389,961** | **1,743,091,824** | **13,887,481,786** |

## 7.2 ආපසු එවීමේ පදනම යටතේ විකුණුම්

විකුණුම් ආපසු එවීම්, සංස්ථාවේ සමස්ථ විකුණුම් හා සසඳන කළ ප්‍රමාණාත්මක නොවේ. කෙසේ වුවත්, විකුණුම් ආපසු හරවා එවීමේ සම්භාවිතාව හා එවැනි ප්‍රමාණාත්මක හරවා එවීම් පවතී නම් ගැලපීම සඳහා නිරීක්ෂණය කරයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 8 විකුණුම් පිරිවැය/සෘජු වියදම් - ර.බෙ.ග

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| **ආදායම** | **70,811,344,509** | **54,323,564,615** |
| **සෘජු වියදම්** | | |
| ර.බෙ.ග. ඇණවුම් වල පිරිවැය (මි.ර.ගැ.වටිනාකම) | 21,964,064,214 | 27,265,309,832 |
| බදු හා තීරුගාස්තු | 752,126,279 | 631,465,369 |
| දේශීය සැපයුම් පිරිවැය | 28,171,554,257 | 17,799,064,813 |
| ම.මි.ගැ.ඒකකය හරහා සැපයුම් - ර.බෙ.ග. | 2,658,720,341 | 5,723,880,376 |
| එන්නත් ආනයනය ( සටහන 7.1) | 12,144,389,961 | |
| **එකතුව** | **65,690,855,053** | **51,419,720,390** |
| **වෙනත් සෘජු වියදම්** | | |
| නිෂ්කාශන ගාස්තු( මුද්දර ගාස්තු, කොමිස්,ණයවර ලිපි ගාස්තු හා අනෙකුත්) | 987,060,371 | 485,821,427 |
| ගොඩබෑමේ වියදම් | 97,182,364 | 60,287,195 |
| ආනයන බලපත්‍ර ගාස්තු | 191,506,861 | 126,640,396 |
| සැපයුම් කරුවන්ගෙන් අයකිරීම් - ම.මි.ගැ.ඒකකය | - | 12,393,755 |
| **එකතුව** | **1,275,749,596** | **685,142,773** |
| **මුළු වටිනාකම** | **66,966,604,648** | **52,104,863,163** |
| **අඩුකලා: මාර්ගස්ථ තොග** | 697,376,583 | 1,196,371,305 |
| **සෘජු වියදම්/ විකුණුම් පිරිවැය** | 66,269,228,066 | 50,908,491,858 |
| **දළ ලාභය/අතිරික්තය** | **4,542,116,443** | **3,415,072,757** |

## 9 විකුණුම් පිරිවැය - රා.ඖ.ස.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | තොග වෙළඳාම<br>රු. | ඔසුසල වෙළඳාම<br>රු. | මුළු වෙළඳාම රා.ඖ.ස.- 2021<br>රු. | මුළු වෙළඳාම රා.ඖ.ස.- 2020<br>රු. |
|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ වෙළඳ තොගය | 1,432,873,377 | 1,280,058,686 | 2,712,932,063 | 2,707,619,897 |
| **එකතු කළා:** | | | | |
| ආනයනික බෙහෙත් | 2,399,883,034 | | 2,399,883,034 | 2,577,032,563 |
| රසායනාගාර අමුද්‍රව්‍ය | 3,297,618 | | 3,297,618 | 4,481,303 |
| ර.ඖ.ස. ටෙන්ඩර් සඳහා දේශීය මිලදී ගැනුම් | 1,893,636,859 | | 1,893,636,859 | 1,425,224,619 |
| ම.මි.ගැ. ඒකකයේ මිලදී ගැනුම් | 247,218,409 | | 247,218,409 | 331,857,819 |
| ඔසුසල සඳහා දේශීය මිලදී ගැනුම් ( සටහන 30. | - | 2,270,752,265 | 2,270,752,265 | 2,206,092,540 |
| තොග මාරු කිරීම් (සටහන 30.1) | (3,007,962,686) | 3,007,962,686 | - | - |
| **විකිණීම සඳහා තිබූ වෙළඳ තොගය** | **2,968,946,611** | **6,558,773,637** | **9,527,720,248** | **9,252,308,742** |
| **අඩු කලා: වර්ෂය අවසානයේ වෙළඳ තොගය** | 1,139,665,189 | 1,302,588,718 | 2,442,253,906 | 2,816,568,177 |
| **විකුණුම් පිරිවැය හා මාරුකිරීම්** | **1,829,281,422** | **5,256,184,920** | **7,085,466,342** | **6,435,740,565** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 10 ග්ලූකෝස්, ජීවනී සහ බී.බී. ක්‍රීම් නිෂ්පාදන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| අමුද්‍රව්‍ය ආරම්භක තොගය | 1,148,181 | 2,056,396 |
| **එකතු කලා:** අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 55,319,722 | 35,333,552 |
| **අඩු කලා:** අමුද්‍රව්‍ය අවසන් තොගය | 854,087 | 1,148,181 |
| **භාවිතා කළ අමුද්‍රව්‍ය පිරිවැය** | **55,613,816** | **36,241,767** |
| **එකතු කලා:** නිෂ්පාදන පිරිවැය - (සටහන 10.1) | 80,145,514 | 77,017,327 |
| **තොගයේ නිෂ්පාදන පිරිවැය** | **135,759,330** | **113,259,094** |

**ජීවනී වෙළඳාම**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| ආරම්භක තොගය (නිමි භාණ්ඩ) | 1,059,986 | 431,493 |
| **එකතු කලා:** තොගයේ නිෂ්පාදන පිරිවැය | 135,759,330 | 113,259,094 |
| **අඩු කලා:** අවසාන තොගය (නිමි භාණ්ඩ) | - | 1,059,986 |
| **විකුණුම් පිරිවැය** | **136,819,315** | **112,630,601** |
| විකුණුම් | 159,003,516 | 134,564,549 |
| අඩුකලා: විකුණුම් පිරිවැය | 136,819,315 | 112,630,601 |
| **දළ වෙළඳ ලාභය** | **22,184,201** | **21,933,948** |

## 10.1 නිෂ්පාදන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| වැටුප්, වේතන හා දීමනා | 34,793,626 | 29,856,247 |
| අතිකාල දීමනා | 3,686,724 | 3,012,006 |
| නිල ඇඳුම් | 20,400 | 618,556 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 551,461 | 367,197 |
| අර්ථසාධක (EPF & ETF) | 4,115,649 | 3,531,798 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 432,000 | 432,000 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 797,250 | 890,400 |
| වාර්ෂික කාර්ය සාධන ප්‍රසාද දීමනා | 2,293,866 | 2,274,321 |
| සේවක සුභසාධන වියදම් | 1,409,532 | 1,271,183 |
| වෛද්‍ය වියදම් | 459,359 | 479,352 |
| විදුලිය | 4,184,953 | 4,208,003 |
| ක්ෂය කිරීම් | 10,763,486 | 12,708,553 |
| අලුත්වැඩියා හා නඩත්තු | 3,988,416 | 1,629,287 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 12,648,792 | 15,738,424 |
| **එකතුව** | **80,145,514** | **77,017,327** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 11 අනෙකුත් මෙහෙයුම් ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| **රා.ඖ.ස** | | |
| ටෙන්ඩර් හා ආකෘති පත්‍ර විකුණුම් | 68,321,136 | 79,922,549 |
| ගෙවල් කුලී ලැබීම් | 53,336 | 678,122 |
| භාණ්ඩාගාර බිල්පත් පොලී | 4,787,139 | 6,234,105 |
| අබලි ද්‍රව්‍ය විකුණුම් | 54,385 | 106,836 |
| අරමුදල් කළමනාකරන ආදායම් | 4,438,930 | 33,616,653 |
| විවිධ ආදායම් | 4,193,070 | 10,533,743 |
| නිවාඩු නිකේතනයන් ගෙන් ලද ආදායම් | 149,425 | 343,125 |
| පෙර සුදුසුකම් ලබාදීමේ ගාස්තු | - | 1,268,250 |
| සාම්පල් පරීක්ෂාකිරීමේ ආදායම් | 2,149,560 | 2,414,553 |
| විනිමය හුවමාරු ලාභ/පාඩු | - | 20,929,804 |
| "Prescriber" සඟරාව | 12,125 | |
| සැපයුම් කරුවන්ගේ සම්මේලනයෙන් ලද ලාභය | - | 175,000 |
| නිෂ්කාශනය නොවූ හා ප්‍රමාදවූ චෙක්පත් මත දඩ | 2,517,801 | 2,444,472 |
| වත්කම් ඉවත් කිරීම් මත ලාභ | 1,854,296 | - |
| **එකතුව** | **88,531,203** | **158,667,212** |
| **ර.බෙ.ග.** | | |
| විනිමය හුවමාරු ලාභ/පාඩු | - | 128,695,911 |
| **එකතුව** | **-** | **128,695,911** |
| **මුළු එකතුව** | **88,531,203** | **287,363,124** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**12** පරිපාලන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඕ෴.ස. වෙළඳ කටයුතු ඔසුසල | ජීවනී ඒකකය | තොග වෙළඳාම | මුළු වෙළඳාම රා.ඕ෴.ස. | මුළු වෙළඳාම ර.බෙ.ග. | මුළු වෙළඳාම 2021 | මුළු වෙළඳාම 2020 |
|---|---|---|---|---|---|---|---|
| **සේවක වේතන** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වැටුප්, වේතන හා දීමනා | 463,353,737 | - | 277,887,788 | 741,241,525 | 353,675,366 | 1,094,916,891 | 956,389,952 |
| අතිකාල දීමනා | 31,588,344 | - | 9,587,663 | 41,176,008 | 6,391,775 | 47,567,783 | 57,056,172 |
| සේවක පුහුණු වියදම් | - | - | 248,820 | 248,820 | 316,680 | 565,500 | 570,460 |
| නිල ඇඳුම් | 3,127,759 | - | 764,026 | 3,891,784 | 972,396 | 4,864,180 | 5,187,027 |
| රෝහල් ගාස්තු ප්‍රතිපූරණය | 6,337,994 | - | 5,594,174 | 11,932,168 | 7,119,858 | 19,052,026 | 12,818,910 |
| අර්ථසාධක | 54,341,008 | - | 33,126,387 | 87,467,395 | 42,160,856 | 129,628,252 | 112,123,647 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 5,076,113 | - | 3,144,661 | 8,220,774 | 4,002,296 | 12,223,070 | 12,147,515 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 10,164,850 | - | 5,320,260 | 15,485,110 | 6,771,240 | 22,256,350 | 25,303,270 |
| ක්‍රීඩා සමාජ | - | - | 355,281 | 355,281 | 452,176 | 807,457 | 422,730 |
| වාර්ෂික කාර්ය සාධන ප්‍රසාද දීමනා | 29,234,692 | - | 17,923,863 | 47,158,554 | 22,812,189 | 69,970,743 | 67,071,626 |
| සේවක පාරිතෝෂිකය ( සටහන 26.3) | - | - | 32,474,424 | 32,474,424 | 41,331,086 | 73,805,510 | 64,645,469 |
| ඉඩම්/නිවාස ණය පොලී | 3,836,663 | 74,503 | 2,264,951 | 6,176,117 | 2,882,665 | 9,058,782 | 8,608,338 |
| රා.ඕ෴.නි.ස. සංවත්සර ගෙවීම් | - | - | 668,536 | 668,536 | 850,864 | 1,519,400 | 3,508,258 |
| මරණ පාරිතෝෂිකය | - | - | - | - | - | - | 748,394 |
| **එකතුව** | **607,061,160** | **74,503** | **389,360,834** | **996,496,497** | **489,739,448** | **1,486,235,945** | **1,326,601,769** |
| **ගමන් වියදම්** | | | | | | | |
| විදේශ ගමන් වියදම් | - | - | - | - | - | - | 104,375 |
| දේශීය ගමන් වියදම් | 716,128 | 650 | 5,833,133 | 6,549,912 | 648,126 | 7,198,038 | 18,214,056 |
| **එකතුව** | **716,128** | **650** | **5,833,133** | **6,549,912** | **648,126** | **7,198,038** | **18,318,431** |
| **සැපයුම් හා අවශ්‍යයතා** | | | | | | | |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 8,012,594 | 571,274 | 12,120,737 | 20,704,604 | 4,040,246 | 24,744,850 | 23,476,387 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම් | - | - | 20,291 | 20,291 | 6,764 | 27,055 | 33,945 |
| වෙනත් සංග්‍රහ වියදම් | - | - | 199,466 | 199,466 | 66,489 | 265,955 | 280,646 |
| රථවාහන අළුත්වැඩියා වියදම් | - | - | 8,840,453 | 8,840,453 | 2,946,818 | 11,787,271 | 10,609,224 |
| ඉන්ධන වියදම් | - | - | 10,802,811 | 10,802,811 | 3,600,937 | 14,403,748 | 15,383,858 |
| වාහන බලපත්‍ර ගාස්තු | - | - | 152,519 | 152,519 | 50,840 | 203,359 | 212,466 |
| **එකතුව** | **8,012,594** | **571,274** | **32,136,278** | **40,720,145** | **10,712,093** | **51,432,238** | **49,996,525** |
| **අළුත්වැඩියා හා නඩත්තු** | | | | | | | |
| ගොඩනැගිලි | 2,315,515 | - | 4,072,282 | 6,387,798 | 4,072,282 | 10,460,080 | 8,679,314 |
| ලීබඩු, සවිකිරීම් හා උපකරණ | 3,363,382 | - | 1,523,095 | 4,886,477 | 1,523,095 | 6,409,572 | 11,849,634 |
| පරිගණක | 148,328 | - | 4,747,124 | 4,895,452 | 4,747,124 | 9,642,576 | 7,947,938 |
| **එකතුව** | **5,827,225** | **-** | **10,342,502** | **16,169,726** | **10,342,502** | **26,512,228** | **28,476,886** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 12 පරිපාලන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඕ.ස. වෙළඳ කටයුතු ඔසුසල | ජීවනී ඒකකය | තොග වෙළඳාම | මුළු වෙළඳාම රා.ඕ.ස. | මුළු වෙළඳාම ර.බෙ.ග. | මුළු වෙළඳාම 2021 | මුළු වෙළඳාම 2020 |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගීතා හා වෙනත් සේවා** | | | | | | | |
| කුලී හා භාවිත අයිතිය සහිත වත්කම් ක්‍රමක්ෂය (සටහන 17.2) | 28,561,831 | - | 2,265,981 | 30,827,812 | - | 30,827,812 | 27,699,588 |
| කුලිය "මෙහෙවරපියස" | - | - | 4,200,000 | 4,200,000 | 4,200,000 | 8,400,000 | - |
| කල්බදු කුලී ක්‍රමක්ෂය | 617,474 | - | 160,000 | 777,474 | - | 777,474 | 778,474 |
| වරිපනම් ගාස්තු හා බදු | 893,113 | - | 582,890 | 1,476,002 | 582,890 | 2,058,892 | 2,132,183 |
| වතුර බිල් | 944,834 | 103,896 | 563,900 | 1,612,629 | 563,900 | 2,176,529 | 2,106,552 |
| විදුලිය | 21,162,940 | - | 13,976,573 | 35,139,514 | 13,976,573 | 49,116,087 | 48,408,501 |
| තැපැල්, විදුලිපණිවුඩ හා දුරකථන ගාස්තු | 2,456,142 | 46,058 | 6,652,597 | 9,154,797 | 6,652,597 | 15,807,395 | 16,770,636 |
| වෙළඳ දායකත්ව සහ සඟරා | 234,890 | - | 153,910 | 388,800 | 153,910 | 542,710 | 500,420 |
| වෘත්තීය ගාස්තු | - | - | 5,330,160 | 5,330,160 | 5,330,160 | 10,660,320 | 976,783 |
| රක්ෂණ | - | - | 1,732,344 | 1,732,344 | 1,732,344 | 3,464,687 | 4,813,542 |
| පුවත්පත් දැන්වීම් | - | - | 5,585,342 | 5,585,342 | 13,032,464 | 18,617,805 | 14,653,743 |
| ආරක්ෂක සේවා | 24,047,983 | 605,722 | 6,163,984 | 30,817,689 | 6,163,984 | 36,981,673 | 36,112,345 |
| වාර්ෂික ක්ෂය කිරීම් | 28,972,932 | - | 21,007,014 | 49,979,946 | 21,007,014 | 70,986,959 | 78,553,908 |
| පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය | 816,860 | - | - | 816,860 | - | 816,860 | 700,166 |
| බෙහෙත් බලපත්‍ර ගාස්තු | 1,222,524 | - | 9,762,633 | 10,985,156 | - | 10,985,156 | 16,401,049 |
| විවිධ වියදම් | 96,277 | - | 210,234 | 306,511 | 98,934 | 405,444 | 431,922 |
| අධ්‍යක්ෂ ගාස්තු | - | - | 330,000 | 330,000 | 330,000 | 660,000 | 620,000 |
| විගණන ගාස්තු | - | - | 663,203 | 663,203 | 663,203 | 1,326,405 | 2,570,595 |
| ටෙන්ඩර මණ්ඩල රැස්වීම් ගාස්තු | - | - | 7,211,424 | 7,211,424 | 16,826,656 | 24,038,080 | 11,310,200 |
| සේවක සුභසාධන වියදම් | 23,080,972 | - | 24,209,006 | 47,289,979 | 30,811,463 | 78,101,442 | 46,830,337 |
| සේවක වෛද්‍ය වියදම් | 5,745,410 | - | 3,550,769 | 9,296,179 | 4,519,160 | 13,815,339 | 13,417,244 |
| ප්‍රදාන | - | - | 1,066,944 | 1,066,944 | - | 1,066,944 | 3,683,694 |
| නිවාඩු නිකේතන වියදම් | - | - | 824,098 | 824,098 | 1,048,852 | 1,872,950 | 968,016 |
| ප්‍රධාන කාර්යාලය "මෙහෙවරපියස" වෙත ගෙනඒමේ වියදම | - | - | 6,137,023 | 6,137,023 | 6,137,023 | 12,274,045 | - |
| **එකතුව** | **138,854,182** | **755,675** | **122,340,026** | **261,949,883** | **133,831,124** | **395,781,008** | **330,439,895** |
| | | | | | | | |
| **සමස්ථ පරිපාලන වියදම** | **760,471,288** | **1,402,102** | **560,012,774** | **1,321,886,163** | **645,273,292** | **1,967,159,456** | **1,753,833,505** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 13 වෙනත් මෙහෙයුම් වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඖ.ස. වෙළඳ කටයුතු | | | මුළු | මුළු | මුළු | මුළු |
|---|---|---|---|---|---|---|---|
| | | | තොග | වෙළඳාම | වෙළඳාම | වෙළඳාම | වෙළඳාම |
| | ඔසුසල | ජීවනී ඒකකය | වෙළඳාම | රා.ඖ.ස. | ර.බෙ.ග. | 2021 | 2020 |
| **විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම්** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් ප්‍රවර්ධන වියදම් | - | - | 12,265,573 | 12,265,573 | - | 12,265,573 | 6,866,117 |
| Prescriber - ප්‍රකාශන සඳහා වියදම් | - | | - | - | - | - | 1,324,509 |
| ප්‍රවාහන ගාස්තු | - | - | 9,702,181 | 9,702,181 | - | 9,702,181 | 13,189,923 |
| බොල්ණය සඳහා වෙන්කිරීම | - | - | (15,654,623) | (15,654,623) | 493,742,965 | 478,088,341 | 597,927,077 |
| ඔසුසල වෙළඳාම මත වට්ටම් | - | - | 12,655,394 | 12,655,394 | - | 12,655,394 | 9,391,436 |
| අමතර වට්ටම් | - | | 90,007,660 | 90,007,660 | | 90,007,660 | 106,742,654 |
| අගය එකතු කිරීමේ බදු | - | | 2,371,449 | 2,371,449 | 7,114,348 | 9,485,797 | 10,295,700 |
| තොග අලාභ | - | - | 319,034 | 319,034 | - | 319,034 | 1,137,164 |
| අතිරික්ත/හිඟ තොග ගැලපීම | 558,069 | - | (13,991) | 544,078 | - | 544,078 | (8,154) |
| හානිවූ හා යල්පැනගිය තොග වෙන්කිරීම | 13,186,667 | - | 115,746,194 | 128,932,861 | - | 128,932,861 | 103,644,268 |
| හානිවූ හා යල්පැනගිය තොග වෙන්කිරීම-ර.බෙ.ග | - | - | - | - | 28,505,210 | 28,505,210 | 93,389,052 |
| මුද්දර ගාස්තු | - | | 420,275 | 420,275 | - | 420,275 | 460,200 |
| ඔසුසල් පිහිටුවීමේ වියදම් | - | - | 3,545,499 | 3,545,499 | - | 3,545,499 | 318,630 |
| ගබඩා කුලී | - | | - | - | 12,098,013 | 12,098,013 | 4,741,451 |
| Foreign exchange gain/loss | - | - | 22,963,591 | 22,963,591 | 333,365,043 | 356,328,633 | - |
| විවිධ ඇසුරුම් ද්‍රව්‍ය | 12,444,986 | - | 45,293 | 12,490,279 | - | 12,490,279 | 11,685,156 |
| **එකතුව** | **26,189,722** | **-** | **254,373,529** | **280,563,252** | **874,825,579** | **1,155,388,830** | **961,105,182** |
| **පර්යේෂණ හා සංවර්ධන වියදම්** | | | | | | | |
| පර්යේෂණ සඳහා ඖෂධ | - | - | 5,516 | 5,516 | 10,245 | 15,761 | 20,759 |
| සාම්පල පරීක්ෂා කිරීමේ ගාස්තු | - | - | 922,525 | 922,525 | 1,713,262 | 2,635,787 | 934,342 |
| සාම්පල් බෙහෙත් සඳහා | - | - | 3,941 | 3,941 | 7,318 | 11,259 | 18,036 |
| **එකතුව** | **-** | **-** | **931,982** | **931,982** | **1,730,825** | **2,662,807** | **973,137** |
| **මුළු වෙනත් මෙහෙයුම් වියදම** | **26,189,722** | **-** | **255,305,512** | **281,495,234** | **876,556,403** | **1,158,051,637** | **962,078,319** |

## 14 මූල්‍ය වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | රා.ඖ.ස. වෙළඳ කටයුතු | | | මුළු | මුළු | මුළු | මුළු |
|---|---|---|---|---|---|---|---|
| | | | තොග | වෙළඳාම | වෙළඳාම | වෙළඳාම | වෙළඳාම |
| | ඔසුසල | ජීවනී ඒකකය | වෙළඳාම | රා.ඖ.ස. | ර.බෙ.ග. | 2021 | 2020 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බැංකු අයිරා පොලිය | - | - | 129,717 | 129,717 | 569,494,709 | 569,624,426 | 686,878,333 |
| වසරට අදාල කල්බදු පොලීය ( සටහන 17.2) | - | - | 8,455,972 | 8,455,972 | - | 8,455,972 | 8,326,647 |
| බැංකු ගාස්තු | | | 2,099,749 | 2,099,749 | - | 2,099,749 | 2,261,061 |
| **සමස්ථ මූල්‍ය වියදම** | **-** | **-** | **10,685,438** | **10,685,438** | **569,494,709** | **580,180,147** | **697,466,041** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 15 බදු වියදමේ ප්‍රධාන අන්තර්ගතයන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| වසර සඳහා බදු වියදම (සටහන 15.1) | 799,307,372 | 664,702,039 |
| පෙර වසර වලට අදාල අතිරික්ත/ ඌන වෙන්කිරීම | 416,123 | 12,423,221 |
| **ගැලපුවා:** තාවකාලික වෙනස්කම් ගැලපීම මත - | (27,551,310) | (100,724,309) |
| - විලම්බිත බදු වියදම/ආදායම (සටහන 20) | | |
| **සමස්ථ බදු වියදම** | **772,172,185** | **576,400,951** |

## 15.1 වසරේ වාර්තාවූ ලාභය හා ආදායම් බදු වියදම සැසඳීම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 3,156,736,063 | 2,545,624,468 |
| අඩු කිරීමට ඉඩ නොහරින වියදම් | 350,131,154 | 382,266,378 |
| සුදුසුකම් ලැබූ ගෙවීම් ( ප්‍රදාන) | (176,419,835) | (158,299,018) |
| **බදු ගෙවිය යුතු ආදායම** | **3,330,447,382** | **2,769,591,828** |
| ආදායම් බද්ද @ 24% | 799,307,372 | 664,702,039 |
| **ප්‍රවර්ථන වර්ෂයේ ලාභය මත බද්ද** | **799,307,372** | **664,702,039** |
| පෙර වසර වලට අදාල අතිරික්ත/ඌන වෙන්කිරීම | 416,123 | 12,423,221 |
| **ගැලපුවා:** තාවකාලික වෙනස්කම් ගැලපීම මත - | | |
| - විලම්බිත බදු වියදම/ආදායම (සටහන 20) | (27,551,310) | (100,724,309) |
| **බදු වියදම** | **772,172,185** | **576,400,951** |
| **ඵලදායී බදු අනුපාතය %** | **24.5** | **22.6** |

-

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 16 දේපල පිරියත හා උපකරණ

| | සින්නක්කර ඉඩම් | ගොඩනැගිලි | රථ වාහන | පාපැදි | දැව භාණ්ඩ හා සවිකිරීම් | උපකරණ | යන්ත්‍ර හා පිරියත | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය හෝ පිරිවැය ලෙස උපකල්පිත අගය | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීමහේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවාදැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
-------------------------------------------------------------

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ), (ඇ) හා (ඉ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණහැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලටඅනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව<br>---------------------------------------- | | නිරීක්ෂණය<br>---------------- |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත<br>---------------------------------- | |
| | (i) 10(5) වගන්තිය හා 2021 දෙසැම්බර් 16 දිනැති අංක PED/A/REV/1/15(ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | සෑම වර්ෂයකදීම පනතේ සඳහන් විසර්ජනයන්ගෙන් පසු ඉතිරිවන ශුද්ධ අතිරික්ත ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 350 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. එසේ වුවද, 2022 ජූලි 20දින වන විට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 128 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර පිණිස මහා භාණ්ඩාගාරය වෙත යවා තිබුණු අතර යැවීමට ඇති ඉතිරි මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර හෝ නොතිබුණි. |
| | (ii) 14 (3) වගන්තිය | යම් කිසි වර්ෂයක් වෙනුවෙන් පිළියෙල කරන වාර්ෂික වාර්තාව අදාළ අනෙකුත් ලියවිලි සමඟ ඊළඟ වර්ෂය ආරම්භවී මාස 10 ක් ඉක්මවීමට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මෙම වාර්තාවේ දිනය වන විටත් 2018, 2019 සහ 2020 යන වර්ෂ 03 සඳහා වාර්ෂික වාර්තා පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------------------- | |
| | (i) මුදල් රෙගුලාසි 103, 104 හා 105 | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.191,865,426 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වූ තොග සහ එදිනට පිරිවැය රු.40,711,703 ක් වූ ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) හා (ඊ) | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, ලංකා බැංකු ජංගම ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ මාස 02 ක ප්‍රමාදයකින් පසුව පිළියෙල කර තිබුණු අතර සම්පත් බැංකු |

| | | |
|---|---|---|
| | | ජංගම ගිණුමට අදාළව 2021 දෙසැම්බර් මාසයෙන් අවසන් මාස 09 සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. එමෙන්ම බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් ගණන්දීමේ නිලධාරී වෙත දැනුම්දී නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 571 | 2021 දෙසැම්බර් 31 දිනට පැවති, තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්මවා තිබුණු එකතුව රු.349,926 ක තැන්පතු නිරවුල් කිරීමට හෝ අදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 756 හා 757 (2) | ස්ථාවර වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කර එම සමීක්ෂණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ වාර්තා 2022 ජුනි 05 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉතිරි වාර්ෂික නිවාඩු සඳහා රු.70,631,972 ක්ද, එක් සේවකයකු වෙත මාසික වේතනයක් බැගින් කාර්යසාධන දිරි දීමනා ලෙස රු.70,917,585 ක්ද කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. |
| (ඈ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක PED/03/2018 හා 2021 දෙසැම්බර් 15 දිනැති අංක PED/03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | සාමූහික ගිවිසුමක් සහිත සංස්ථාවට මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගත නොහැකි වන නමුත් මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් සේවකයකුට රු.13,500 බැගින් රු.12,472,594 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 4.3 ඡේදය | ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීම හා ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සංස්ථාව විසින් අවදානම් කළමණාකරණ කමිටුවක් පත්කළ යුතු වුවද, 2022 මැයි 31 දින වන විටත් එම කමිටුව පත් කර නොතිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.122,520,480 ක් වූ පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා චක්‍රලේඛ විධිවිධානවලට අනුගතවන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂමලෙසසහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රු.373,196,150 ක් වැයකර ඖෂධ මිලදී ගැනීමේ අවස්ථා 03 කදී පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් ලබාගෙන නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම පිළිබඳව සංස්ථාව අනුගමනය කරන ක්‍රියාපිළිවෙත අනුව රු.මිලියන 50 ඉක්මවන ප්‍රසම්පාදනයන් ඇගයීම සඳහා 05 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙනුවට තිදෙනෙකුගෙන් පමණක් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි.

(ආ) කොවිඩ් 19 වසංගතය සමඟ ඇති වූ හදිසි ප්‍රසම්පාදනයක් ලෙස හඳුනාගෙන සෘජු මිලදී ගැනීමේ ක්‍රමය අනුගමනය කරමින්, කිසිදු තාක්ෂණික ඇගයීමක් සිදු නොකර, එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුම මත පදනම්ව ප්‍රසම්පාදනය සිදුකර, සංස්ථාවේ අලෙවිය සඳහා 2020 වර්ෂයේදී රු.14,270,000 ක් වැයකර එකක් රු.1,400බැගින් Safety Goggles10,000 ක් හා එකක් රු.1,350බැගින් Safety Goggles 200ක්මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමින් සියයට 20 ක අත්තිකාරමක් ගෙවිය හැකි නමුත් ඊට පටහැනිව සියයට 50 ක අත්තිකාරමක් ලෙස රු.මිලියන 07 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිලකියුමට, ගැණුම් ඇණවුමටහා භාණ්ඩ ලැබීම් පත්‍රයටඅනුව Seals Safety Goggles සපයා තිබිය යුතු වුවද, ඒ වෙනුවට Swimming Goggles10,200 ක් සපයා තිබුණු බව සිදුකළ භෞතික විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව හා නිසි අලෙවි පුරෝකථනයකින් තොරව මිලදී ගෙන තිබීම හේතුවෙන් Swimming Goggles10,200 න් 54 ක් පමණක් එකක් රු.1,610 බැගින් අලෙවිකර තිබුණු අතර මුළු පිරිවැය රු.13,915,700 ක් වූ Swimming Goggles9,945 ක් ඉතිරිව පැවති බවත් මුළු පිරිවැය රු.281,400ක් වූ Goggles 201 ක ඌනතාවයක් පැවති බවත් 2021නොවැම්බර් 09 හා 24 යන දිනවලදී සිදුකළ භෞතික පරීක්ෂණවලදී අනාවරනය විය.

(ඇ) වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවය සඳහා 2020 වර්ෂයේදී පිරිවැය රු.21,492,357ක් වූපුද්ගල ආරක්ෂක උපකරණ (Personal protective equipment-(PPE))කට්ටල 5,000 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින් හෝ සංස්ථාව විසින් PPE කට්ටල සඳහා අවශ්‍යතා පිරිවිතර පිළියෙල කර නොතිබුණු අතරකිසිදු ආකාරයක මිල කැඳවීමක් හා තාක්ෂණික ඇගයීමක් සිදු නොකර එක් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණු Profoma Invoice මත මිලදී ගැනීම සිදු කර තිබුණි.ඇනවුම් කර තිබුණු PPE කට්ටල 5,000 න් කට්ටල 2,000 ක තොගයක් සංස්ථාව වෙත ලැබී වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත්, සපයා ඇත්තේ “Isolation Gown”පමණක් බවත්වෛද්‍ය සැපයීම් අංශය ඉදිරිපත් කළ ඇණවුමේ සඳහන්ව ඇත්තේ “PPE Set”වශයෙන් බවත් සඳහන් කරමින් අදාළ තොගය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ තිබියදී PPE කට්ටල 3,000 කින් සමන්විත දෙවන තොගයද සැපයුම්කරු වෙතින් භාර ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණු නමුත් පෙර දැක්වූ හේතුවම දක්වමින් එම තොගයද ප්‍රතික්ෂේප කර තිබුණි. සැපයුම්කරු වෙත ගෙවා තිබුණුරු.21,492,357ක් හා සේවා ගාස්තු රු.8,129,360 ක්වෛද්‍ය සැපයීම් අංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිවීම නිසා සංස්ථාවට රු.29,621,717ක අලාභයක් සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සිදු කළ භෞතික පරීක්ෂාවකදී PPE කට්ටල 4,997ක් ගබඩාවේ පැවති බවත්, කට්ටල 03 ක ඌනතාවයක් පැවති බවත් නිරීක්ෂණය විය.

(ඇ) වෛද්‍ය සැපයුම් අංශය විසින් 2021 වර්ෂයෙහි අවශ්‍යතාවයලෙස හදුනාගෙන තිබුණු Papaverine HCL injection 60mg/2ml එන්නතින් ඒකක 1,560 ක් රු.68,595,384 ක් වැය කර මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සංස්ථාව විසින් සිදු කර තිබුණු අන්තර්ජාතික විවෘත තරඟකාරී ලංසු කැඳවීමට අනුව එක් ලංසුකරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු බැවින්ද හා එන්නත් ඒකකයක ඇස්තමේන්තු මිලරු.255.07 ක් වුවද ඒකකයක් සඳහා ලංසුව රු.40,868.98ක්වූ බැවින්ද, නැවත මිල ගණන් කැඳවිය යුතුව තිබුණු නමුත් එපරිදි කටයුතු නොකර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම එන්නත් ඒකකයක් රු.40,868.98ක් බැගින් එන්නත් ඒකක 3,125ක් රු.127,715,569 කට මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම පිළිබඳව සංස්ථාව අනුගමනය කරන ක්‍රියාපිළිවෙත අනුව රු.මිලියන 50 ඉක්මවන ප්‍රසම්පාදනයන් ඇගයීම සඳහා 05 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කළ යුතු වුවද,03 දෙනෙකුගෙන් පමණක් සමන්විත සංස්ථාව විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ලංසු ඇගයීම සිදුකරතිබුණි.ණයවර ලිපි විවෘත කිරීමට පෙර පවතින තොග මට්ටම සලකා බැලීමෙන් පසුව හෝ ඒ පිළිබඳ වෛද්‍ය සැපයීම් අංශයේ අනුමැතියලබා ගැනීමෙන් පසුව හෝ ඇණවුම් කළ යුතු බවවෛද්‍ය සැපයීම් අංශය විසින් දන්වා තිබුණු නමුත් සංස්ථාව එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව වාර්ෂික භාවිතය එන්නත් ඒකක 650 ක් බැවින් මුළු එන්නත් ඒකක ප්‍රමාණයෙන් සියයට 40ක් හෙවත් එන්නත් ඒකක 1,250 ක් සඳහා පමණක් ණයවර ලිපි විවෘත කළ යුතුව තිබුණු නමුත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අභිබවාඑන්නත් ඒකක 1,563 ක් වෙනුවෙන් රු.68,727,298 ක ණයවර ලිපි විවෘත කර තිබුණි. 2021 ජූලි 18 දින මිලදී ගෙන තිබුණු එන්නත් ඒකක 1,560 න් එන්නත් ඒකක 1,421 ක් 2022 අගෝස්තු 20 දින වන විට ඉතිරිවී තිබුණු අතර ඒවා 2023 පෙබරවාරි මාසයේදී කල් ඉකුත්වන බව නිරීක්ෂණය විය.කොන්ත්‍රාත් ගිවිසුම 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ ලියාපදිංචි කර ලියාපදිංචි සහතිකය සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

------------------

(අ) සංස්ථාවේ අලෙවිකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රමිත ගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි(Standard Operating Procedure)පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථා අලෙවිය තුළින් රු.10,673,503,000 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු නමුත්සත්‍ය අලෙවිය රු.9,430,951,992 ක් පමණක් වූයෙන් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 11 ක් වූරු.1,242,551,008 කඅලෙවි ඉලක්කයක් ළඟාකර ගත නොහැකිවී තිබුණි.එසේම වෛද්‍ය සැපයුම් අංශය වෙත රු.127,913,984,000 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු නමුත් සත්‍ය අලෙවිය රු.70,110,434,263 ක් පමණක් වූයෙන් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 45 ක් වූ රු.57,803,549,737 ක අලෙවි ඉලක්කයක් ළඟාකර ගත නොහැකිවී තිබුණි.Covid 19 වසංගතතත්ත්වය මෙන්ම වෛද්‍ය සැපයුම් අංශය විසින් සමහර ඇණවුම් ඉදිරි වර්ෂවලට විතැන් කිරීම හා සමහර ඇණවුම් සම්පූර්ණයෙන්ම අවලංගු කිරීම වැනි කරුණු ඊට හේතුවූ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඇ) සංස්ථාවේ අලෙවිය සඳහා සමාලෝචිතවර්ෂයේදී රු.12,483,155 ක් වැය කර Famotidine Tablets USP (40mg) ඖෂධයේ (10*10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 90,000 ක් මිලදී ගෙන තිබුණි. ගබඩාව වෙත ලැබී තිබුණු කාණ්ඩ 02 ක ඖෂධවල කල් ඉකුත්වීමේ දිනය පැනකින් වෙනස්කර තිබුණු බව බව තහවුරු විය. 2021 ඔක්තෝම්බර් 27 දින ගුණත්ව දුර්වලතා කමිටුව විසින් ලබාදී තිබුණු නිර්දේශය ප්‍රකාරව මෙම ඖෂධයේ සියළුම කාණ්ඩවල තොග ප්‍රතික්ෂේප කිරීමට හා තොග ආපසු කැඳවීමට(Withdraw) කටයුතු කර නොතිබුණි. 2022 ජනවාරි 05 දින වන විට කල්ඉකුත් වීමේ දිනය වෙනස් කර තිබුණු පිරිවැය රු.1,300,467 ක් වූ ඇසුරුම් ඒකක 9,376 ක් පමණක් ඉතිරිව තිබුණු බැවින් සැපයුම භාරගත් දිනය වන විටත් කල් ඉකුත්වී තිබුණු ඖෂධ අලෙවි කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සැපයුමට අදාළ දින 22 ක ප්‍රමාදය වෙනුවෙන් තවදුරටත් අයවිය යුතු රු.914,057ක් වූ ප්‍රමාද ගාස්තු මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) සාමාන්‍ය මාසික විකුණුම් ප්‍රමාණය ඇසුරුම් ඒකක 1,159 ක් වූ බැවින් වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය ඇසුරුම් ඒකක 13,908 ක් වුවද ඒ බව නොසලකා හා පෙර ඇණවුමකින් ඇසුරුම් ඒකක 40,000 ක් සංස්ථාව වෙත ලැබීමට නියමිතව තිබුණු නමුත් ඒ බවද නොසලකා, සංස්ථාවේ අලෙවිය සඳහා 2019 වර්ෂයේදී Levofloxacin Tablets (500 mg) ඖෂධයේ (3*10) ප්‍රමාණයේ ඇසුරුම් ඒකක 72,000 ක් ඇණවුම් කර ඉන් ඇසුරුම් ඒකක 36,000 ක් රු.5,522,480 කට මිලදී ගෙන තිබුණි. පෙර ඇණවුමකින් සපයා ගෙන තිබුණු ඇසුරුම් ඒකක 9,092 ක් හා ඇසුරුම් ඒකක 36,000 න් ඇසුරුම් ඒකක 22,357 ක් 2022 පෙබරවාරි 28 දින වන විටත් අලෙවිකර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ වන විට එම ඇසුරුම් ඒකක 45,092 ම කල් ඉකුත්වී තිබීම හේතුවෙන් රු.5,242,790 ක අලාභයක් සිදුවී තිබුණි. නමුත් ඊට වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් තත්ත්වය පිළිබඳ පැවති අඩුපාඩු හේතුවෙන් අලෙවිය සඳහා නිකුත් නොකර රඳවා ගෙන තිබුණු මුළු පිරිවැය රු.4,938,039 ක් වූ ඖෂධ අයිතම 09 ක් 2022 අප්‍රේල් 22 දින වන විටත් කල් ඉකුත්වී තිබුණි. එම තොග සම්බන්ධයෙන් නිසි පියවර නිසි අවස්ථාවේදී නොගැනීම නිසා සංස්ථාවට රු.4,938,039 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඊ) 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 17 ක කාලපරිච්ඡේදය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු නමුත් එම අංශය විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසා රඳවා ගෙන තිබුණු පිරිවැය ගණනය කළ නොහැකි වෛද්‍ය සැපයුම් තොග හා මුළු පිරිවැය රු.345,248,597ක් වූ වෛද්‍ය සැපයුම් තොග පෞද්ගලික ගබඩාවල ගබඩා කිරීමට සිදුවී තිබීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය තුළදී සංස්ථාවට දැරීමට සිදුවී තිබුණුමුළු අතිරේක ගබඩා පිරිවැය රු.19,805,997 ක් විය. එම තොග විධිමත් ලෙස අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් ගබඩා පිරිවැය දිනෙන් දින වැඩිවෙමින් පවතින බවද නිරීක්ෂණය විය.

(උ) වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා සංකීර්ණයේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම නිසා සංස්ථාව විසින් 2021 සහ 2022 වර්ෂවලදී ආනයනය කර තිබුණු ඉන්ඩෙන්ටු 28 කට අදාළ බහලුම් 28 ක් 2021 අගෝස්තු 20 දින සිට 2022 පෙබරවාරි 21 දින දක්වා වූ මාස

06 ක කාලයක් පෞද්ගලික ගබඩාවක රඳවා තබා ගෙන තිබුණු අතර එම මාස 06 සඳහා ගබඩා පිරිවැය ලෙසරු.48,278,583 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. නමුත් සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මෙම අතිරේක පිරිවැය වෛද්‍ය සැපයීම් අංශයෙන් අයකර ගෙන නොතිබුණි.

(ඌ) වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම හේතුවෙන් ඒ සඳහා වැය කර තිබුණු පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.943,753,927ක හරපත් සඳහා මුදල් අයකර ගැනීමට 2022 ජුනි 30දින වන විටත් අපොහොසත් වී තිබුණි. ඉන් රු.71,031,227 ක් අසාධු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතුවූ බැවින් අයකිරීම් අවිනිශ්චිත තත්වයක පැවතුණි.

(එ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් 2021 ජනවාරි 01 දින වන විට තත්වයෙන් අසමත්,කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.215,481,045 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තත්වයෙන් අසමත්,කල් ඉකුත් වූ හා හානි වූ ඖෂධවල මුළු පිරිවැය රු.128,932,861 ක් විය.ඉකුත්වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය රු.40,711,703 කින් රු.25,043,872ක් 2022 ජුනි 01 දින වන විටත් සැපයුම්කරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි.තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ඖෂධ කල්ඉකුත්වීම හා හානිවීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අලාභය රු.191,865,426 ක් විය.

(ඒ) සංස්ථාව සතු ඔසුසල් 50 න් ඔසුසල් 26 ක්ම සමාලෝචිත වර්ෂය තුළදී රු.53,239,900 ක අලාභ ලබා තිබුණි. ඉන් ඔසුසල් 10 ක අලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 15 සිට සියයට 175 දක්වා වූ පරාසයකින් ඉහළ ගොස් තිබුණි. තවද, ඉකුත් වර්ෂය තුළ ලාභ ලබා තිබුණු රත්නපුර, ශ්‍රී ජයවර්ධනපුර රෝහල, බණ්ඩාරගම හා මොනරාගල ස්ථාපිත ඔසුසල් 04 සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබුණි. ඔසුසල් 09 ක ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු ලාභය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ලාභය සියයට 5.7 සිට සියයට 7,411 දක්වා පරාසයකින් අඩුවී තිබුණු බවද නිරීක්ෂණය විය.Covid 19වසංගතතත්ත්වය මීට හේතුවූ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී රු.5,902,985 ක වැඩිම අලාභයක් ලබා තිබුණු දඹුල්ල ඔසුසලේ ඉකුත් වර්ෂයේ අලාභය රු.4,896,404 ක් විය. 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.3,460,998 ක හා රු.4,412,492 ක වෛද්‍ය සැපයුම් හානිවීම හෝ කල් ඉකුත්වීම එවැනි අලාභයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ඖෂධවල විකුණුම් පුරෝකථනයන් මඟින් වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන නොතිබීම හා අඩු අලෙවි ප්‍රතිශතයක් ඇති ඖෂධවල ඉහළ තොග මට්ටම් පිළිබඳ අවධානය යොමු කර ඒවා වැඩියෙන් අලෙවි වන ඔසුසල් වෙත මාරු නොකිරීම මේ තත්ත්වය ඇතිවීමට හේතුවී තිබුණි.

(ඕ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඔසුසල් කාර්ය මණ්ඩලයේ කිසිඳු සංඛ්‍යාත්මක වෙනසක් සිදුවී නොතිබුණු නමුත් ඔසුසල් 32 ක කාර්ය මණ්ඩල වියදම් සියයට 10 සිට සියයට 32 දක්වා පරාසයකින් වැඩිවී තිබුණි. ඉන් ඔසුසල් 12 ක්ම සමාලෝචිත වර්ෂය තුළදී අලාභ ලබා තිබුණු ඔසුසල් විය. එමෙන්ම ශ්‍රී ජයවර්ධනපුර රෝහල්ඔසුසලේ කාර්ය මණ්ඩල වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත

වර්ෂයේදී රු.4,760,913 කින් ඉහළ ගොස් තිබුණු අතර එය එම ඔසුසලේ අලාභය කෙරෙහි සෘජුව බලපා තිබුණි. සාමූහික ගිවිසුමට අනුව සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩල වැටුප් වැඩිවීම හා Covid 19වසංගතතත්ත්වය නිසා ආදායම අඩුවීම මීට හේතුවූ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු ඔක්සිජන් තොග අදාළ සැපයුම්කරු විසින් සෘජුවම රෝහල් වෙත සපයා තිබුණු බැවින් ඒවා වෛද්‍ය සැපයීම් අංශය වෙත ලද බවට සහතික කරන මුද්‍රාව සහිත ඉන්වොයිසිසංස්ථාව වෙත ලබා ගෙන නොතිබීම නිසා අදාළ හරපත් (Debit Note) නිකුත් කිරීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් සැපයුම්කරු වෙත ගෙවා තිබුණු රු.169,260,160 ක් වූ අත්තිකාරම් 2022 මැයි 31 වන දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ග) 2021 දෙසැම්බර් 31 දිනට ඔසුසල්වල භෞතික තොග සමීක්ෂණ වාර්තාවලට අනුව තොග අතිරික්තය රු.4,850,246 ක් හා තොග ඌනතාවය රු.5,408,315 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.5,943,386 ක් හා රු.5,937,198 ක් විය. විකුණුම් ඉන්වොයිස් පිළියෙල කිරීමේදී හා තොග ඇසුරුම් ගත කිරීමේදී සිදු වන දෝෂ, පරිගණක පද්ධතියේ සිදු වන දෝෂ, කාර්යය මණ්ඩලය වෙතින් සිදුවන අඩුපාඩු, පෙති හා කරල් ඖෂධ තොග ලෙස ඇසුරුම් කර නිකුත් කිරීමේදී සුළු ප්‍රමාණ ලෙස නිකුත් කිරීම මගින් ලේබලයේ අඩංගු ප්‍රමාණය සමඟ සිදුවන නොසැසඳීම් ආදී වූ කරුණු තොග ඌනතා හා අතිරික්තතා ඇතිවීමට හේතු වන බව හඳුනාගෙන තිබුණු නමුත් එම දෝෂ අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීමට හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ච) 2021 දෙසැම්බර් 31 දිනට රත්මලාන ගබඩා පරිශ්‍රයේ හා ඔසුසැල් 50 ක භෞතික තොග සමීක්ෂණ වාර්තාවලට අනුව, විකිණිය නොහැකි භාණ්ඩ විශාල ප්‍රමාණයක් විනාශ නොකර ගබඩා පරිශ්‍ර තුළ තබා තිබීම හේතුවෙන් ගබඩාවල ඉඩකඩ ඵලදායී ලෙස භාවිතා කිරීමට නොහැකිවී තිබුණු බව නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේදී හඳුනාගෙන තිබුණු අලෙවි කළ නොහැකි ඖෂධ අයිතම සමාලෝචිත වර්ෂයේ තොග වාර්තාවේද දක්නට ලැබීම, සමහර ඖෂධ තොග අයිතම මෙන්ම විකිණිය නොහැකි ඖෂධ තොග අයිතම දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබීම, ඔසුසල්වල ඖෂධ අයිතම පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු නොකරන බැවින් සෙමින් චලනය වන, චලනය නොවන, කල් ඉකුත් වූ හා යල්පැන ගිය තොග හඳුනා ගැනීමට නොහැකිවීම, ඔසුසල්වල තොග වාර්තා ක්‍රමවත්ව නඩත්තු නොකරන නිසා පවතින තොග හඳුනාගැනීමට නොහැකිවීම, ඔසුසල්වල තොග ගබඩා කිරීමේදී ගබඩා පරිශ්‍රය ඵලදායි ලෙස භාවිතා කර නොතිබීම හා නාරාහේන්පිට ඔසුසලේ හා කොළඹ 01 ඔසුසලේ ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විශාල තොග ප්‍රමාණයක් ගබඩාවෙන් පිටත රඳවා තිබීම, පිටත රඳවාතිබුණු තොග ආරක්ෂිතව ආවරණය කර නොතිබීම මෙන්ම එම ප්‍රදේශයට පිටස්තරයන්ගේ පැමිණීම සීමාකර නොතිබීම හා කොළඹ 01 ඔසුසලේ සමහර ඖෂධ අයිතම ඉන්වොයිසි නිකුත් නොකර විකුණා තිබීම `හේතුවෙන් දත්ත පද්ධතියේ ඒකක අගය හා භෞතික ඒකක අගය අතර වෙනස්කම් පැවතීම යන අඩුපාඩු පවතින බවද නිරීක්ෂණය විය. නමුත් එම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ජ) රත්මලාන ගබඩාවේ අලෙවි කළ හැකිව පැවති2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව මුළු පිරිවැය රු.79,233,418 ක් වූ අයිතම 98 ක් ඉතා කෙටි ජීව කාලයක් (Short Shelf Life) සහිත 2022 වසර තුළදී කල් ඉකුත් වන අයිතම විය. ඒ අතරින් පිරිවැය රු.43,502,964 ක් වූ අයිතම 74 ක් වසරකට වඩා වැඩි කාලයක් තුළදී නොවිකිණී පැවති තොග විය.

(ට) 2016 වර්ෂයේ සිට 2022 පෙබරවාරි 11 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සංස්ථාව විසින් ආනයනය කර වෛද්‍ය සැපයුම් අංශය වෙත භාරදී තිබුණු ඉන්ඩෙන්තු 10කට අදාළ පිරිවැය රු.35,759,829ක් වූ තොග බහලුම් සම්පූර්ණ නොවීම නිසා (Low Consignment Load) වෛද්‍ය සැපයීම් අංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා සංස්ථාව ක්ෂණිකව කටයුතු කර නොතිබීම හේතුවෙන් එම අයිතම 10 ට අදාළ තොග බහලුම් ගබඩා කර තැබීම වෙනුවෙන් වසරක කාල සීමාවක් සඳහා පමණක් රු.1,171,122 ක ගබඩා පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඩ) වෛද්‍ය සැපයීම් කළමනාකරණය සඳහා 2015 වර්ෂයේ සිට හඳුන්වාදී තිබුණු වෛද්‍ය සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) නිසි පරිදි උපයෝගී කර ගෙන නොතිබුණු බවත්, ඖෂධ ඇණවුම් කිරීමේ සිට තොග ලැබෙන අවස්ථාව දක්වා එක් එක් පියවර පද්ධතියට ඇතුළත් කර (Status) අදාළ ඇණවුම සම්බන්ධ ප්‍රගතිය යාවත්කාලීන කිරීමේ පහසුකම එම පරිගණක පද්ධතිය මඟින් ලබාදී තිබුණු නමුත් සංස්ථාවේ නිලධාරීන්ඇණවුමට අදාළ තොරතුරු වසර 07 ක් තිස්සේ පැවති තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් පද්ධතියට ඇතුළත් නොකරන බවත් නිරීක්ෂණය විය. එසේම සංස්ථාව විසින් ඇණවුමට අදාළ තොරතුරු වෙනත් පරිගණක පැවරුම්පත් (Excel) හරහා ගබඩා කර තිබුණු බැවින් ටෙන්ඩරයක තාක්ෂණික ඇගයීම් සිදුකළ දිනය, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදුන් දිනය, ණයවර ලිපි විවෘත කළ දිනය ආදී තොරතුරු පහසුවෙන් ලබා ගත නොහැකිවීම හේතුවෙන් ප්‍රසම්පාදනයේ ප්‍රමාදයට වගකිව යුතු වන්නේ කවුරුන්දැයි පරීක්ෂා කිරීමට හා තීරණ ගැනීමට මෙන්ම ඇණවුමේ වර්තමාන ප්‍රගතිය පිළබඳව තොරතුරු දැනගැනීමටවැඩි කාලයක් ගතවන බව නිරීක්ෂණය විය.වෛද්‍ය සැපයීම් අංශය විසින් ඒ ඒ වර්ෂයට අදාළ ඇණවුම් ලැයිස්තු මාස 11 ක සැපයුම් කාලයක් සහිතව (Lead Time) සංස්ථාව වෙත මෙම පරිගණක පද්ධතිය හරහා ඉදිරිපත් කරන නමුත්, සංස්ථාව විසින් වහාම එම ඇණවුම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණු බවත්, ඇණවුම් ලැයිස්තුවේ ලිඛිත පිටපත් සංස්ථාව වෙත ලැබෙන තෙක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කර තිබුණු බවත්, පරිගණක පද්ධතිය හරහා සංස්ථාව වෙත නිකුත් කරන ඇණවුම්වල ලිඛිත පිටපත් සංස්ථාවේ ආනයන අංශයට එවීමට දින 18 කට වඩා වැඩි කාලයක් ගතකර තිබුණු අතරඉන් පසුව පමණක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු බැවින් මාස 11 ක් වූ සැපයුම් කාල සීමාවෙන් සැලකිය යුතු කාලයක් ඇණවුම් නිකුත් කිරීමේ හා ඇණවුම් ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගත කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ණ) සංස්ථාව සිය මෙහෙයුම් හා පරිපාලන කාර්යයන් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) 14ක් භාවිතා කරන අතර ඉන් පද්ධති 12කින් ඉටුවන කාර්යයන් එක් පද්ධතියක් මඟින් ඉටුකර ගැනීම සඳහා නව ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත් සුදුසුකොන්ත්‍රාත්තුකරුවකු තෝරා ගැනීමට අපොහොසත්වීම මතඇතිවූ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2020 පෙබරවාරි 20 දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂයන් හිදී පිරිවැය රු.32,360,230 ක්වූ පරිගණක උපාංග අයිතම 09 කින් ඒකක 497 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා නොකළ පිරිවැය රු.26,107,265 ක්වූ අයිතම 09 ක ඒකක 375 ක් සංස්ථාවේ වෙනත් කාර්යයන් සඳහා භාවිතයට නිකුත් කර තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබුණු පිරිවැය රු.6,252,965 ක්වූ පරිගණක හා උපාංග අයිතම 06 කින් ඒකක 122 ක් විගණිත දිනය වූ 2022 ජූනි 09 වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යයව පැවතුණි.වර්තමානයේ භාවිතා කරන පද්ධති 12 පාවිච්චි කරන පරිශීලකයින් ගණන 324 ක් වුවද නව පද්ධතිය භාවිතා කිරීමට අපේක්ෂිත පරිශීලකයින් ගණන 1,399 ක් වූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සංස්ථාවේ සියලුම අංශවල කටයුතුවලට දැඩි ලෙස බලපා තිබුණි.

(ත) කොළඹ 07 ඔසුසල සඳහා විදුලි සෝපානයක් සවිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.724,936 ක් ගෙවා තිබුණු අතර එය 2021 දෙසැම්බර් 31 දින වන විටත් නොනිම් වැඩ යටතේ දැක්වෙන නමුත් වසර 07 ක කාල සීමාවක් ගතවී ඇතත් විදුලි සෝපානය සවිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

(ද) 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.258,664,030 ක් වූ අතර ඉන් රු.132,073,302 ක් 2022 මැයි 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.9,941,920 ක් වර්ෂ02 සිට වර්ෂ 04 දක්වා කාලයක් පැරණි නිරවුල් කර නොතිබුණු ශේෂ විය.

(න) 2007, 2008, 2009 හා 2012 වර්ෂවලට අයත්නිරාකරණය නොවූ මාර්ගස්ථ තොගවල (Disputed Goods in Transit)පිරිවැය රු.2,000,577 ක් හා රේගු ගාස්තු රු.12,603,168 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ප) 2021 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු රු.18,623,825 ක් වූ අතර ඉන් රු.6,972,805ක් වර්ෂ 02 ත් වර්ෂ14 ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. මේ අතරින් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළ රු.5,738,822 ක් වූ තැන්පතුවලින් 2021 වර්ෂය තුළදී කිසිදු මුදලක් ආපසු අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(බ) සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී විකුණුම් වටිනාකම් අදාළ වෙළඳ ණයගැතියන්ගෙන් අයකර ගත යුතු වුවද, 2021දෙසැම්බර් 31 දිනට රු.1,311,824,058 ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුළ, පෞද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු රු.22,379,496 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට හා රු.26,871,871 ක් වර්ෂ 01 ත් වර්ෂ 05ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. වර්ෂ 05 කට වඩා පැරණි රු.10,440,050 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණු අතර ඉන් රු.2,368,958 ක් පිළිබඳව පමණක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

(ම) 2021 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබිය යුතු රු.52,850,871,522 කින් රු.211,591,892 ක් වර්ෂ 12 ත් වර්ෂ 23 ත් අතර හා රු.3,585,361,405 ක් වර්ෂ 6 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ය) 2021 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු සංකීර්ණයෙන් අයවිය යුතු රු.14,621,370 කින් රු.9,044,298 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ර) 2021 දෙසැම්බර් 31 දිනට වෙළද ණයහිමියන්ට ගෙවිය යුතු රු.1,217,075,558 කින් රු.115,005,985 ක් වසරකට වඩා කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ල) 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු බිල්පත් ගිණුමේ ශේෂය රු.14,489,595,367 කින් රු.708,416,751 ක් වසර 02කට වඩා වැඩි කාලයක සිට සැපයුම්කරුවන් වෙත නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැදවුම් මුදල් වලින් සමන්විතවී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ව) 2021 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණු විශේෂ ඇණවුම් අත්තිකාරම් රු.21,134,366 කින් රු.982,510 ක් පවුල් සෞඛ්‍ය කාර්යාංශය වෙතින් ලැබී තිබුණු නිරවුල් නොවූ වසර 10 කට වඩා පැරණි ශේෂයක් වන අතර ඉතිරිය යුනිසෙෆ් ආයතනයෙන් ලැබී තිබුණු රු.20,151,856 ක වසර 2 කට වඩා පැරණි ශේෂයකින්සමන්විතවී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ස) 2021 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැතියන් රු.7,661,127 කින් රු.5,678,711 ක් වර්ෂ 24ත් වර්ෂ 05 ත් අතර කාලයක සිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(හ) 2021 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ගෙන් ලැබිය යුතු අත්තිකාරම් රු.928,520,614 කින් රු.3,495,102 ක් වසර 06 ත් වසර 14 ත් අතර කාලයකසිට අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ළ) නියෝජිත කොමිස් අදාළ නියෝජිතයා වෙත පමණක් ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නියෝජිත කොමිස් ලෙස රු.550,912 ක් අදාළ නියෝජිතයා වෙත ගෙවා තිබියදී අදාළ සැපයුම්කරු වෙතද ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

## මානව සම්පත් විශ්ලේෂණය












**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

**වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - ආදායම් වාර්තාව**

රු.'000'

**පිරිවැටුම**

| විස්තරය | 2021 රු. | 2020 රු. | 2019 රු. | 2018 රු. | 2017 රු. | 2016 රු. | 2015 රු. | 2014 රු. | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැටුම - රා.ඖ.ස | 9,446,822 | 8,798,047 | 8,924,850 | 7,458,320 | 6,593,401 | 6,127,478 | 5,286,876 | 4,865,151 | 4,320,300 | 4,283,232 |
| පිරිවැටුම - ර.බෙ.ග | 70,811,345 | 54,323,565 | 42,959,660 | 31,436,986 | 25,970,290 | 26,127,912 | 19,176,807 | 17,269,008 | 16,815,666 | 16,608,492 |
| **මුළු පිරිවැටුම** | **80,258,167** | **63,121,612** | **51,884,510** | **38,895,306** | **32,563,691** | **32,255,390** | **24,463,683** | **22,134,159** | **21,135,966** | **20,891,724** |
| දළ වෙළඳ ලාභය - රා.ඖ.ස | 2,224,536 | 2,249,676 | 2,279,155 | 1,772,559 | 1,680,368 | 1,656,938 | 1,410,722 | 1,247,074 | 1,136,403 | 991,541 |
| දළ අතිරික්තය - ර.බෙ.ග | 4,542,116 | 3,415,072 | 2,717,507 | 2,125,052 | 1,887,026 | 1,850,650 | 1,386,731 | 1,333,198 | 1,185,004 | 1,193,214 |
| **අතිරික්තය** | **6,766,653** | **5,664,749** | **4,996,662** | **3,897,611** | **3,567,394** | **3,507,588** | **2,797,453** | **2,580,272** | **2,321,407** | **2,184,755** |

**පොදුකාර්ය පිරිවැය**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 88,531 | 287,363 | 91,441 | 73,072 | 53,004 | 43,085 | 51,259 | 25,738 | 17,537 | 15,105 |
| පරිපාලන වියදම් | (1,967,159) | (1,753,834) | (1,619,555) | (1,532,485) | (1,288,183) | (1,101,435) | (1,057,970) | (969,744) | (786,904) | (670,635) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (1,158,052) | (962,078) | (971,096) | (691,967) | (741,459) | (580,843) | (563,357) | (749,825) | (791,794) | (745,230) |
| **මෙහෙයුම් ලාභය** | **3,729,973** | **3,236,200** | **2,497,452** | **1,746,231** | **1,590,756** | **1,868,392** | **1,227,385** | **886,441** | **760,246** | **783,995** |
| මූල්‍ය පිරිවැය | (10,556) | (10,588) | (10,763) | (1,512) | (1,295) | (1,071) | (1,599) | (124) | (227) | (17) |
| බැංකු අයිරා පොලිය | (569,624) | (686,878) | (317,470) | (67,406) | (35,199) | (5,434) | (734) | (149,659) | (1,384) | (290,877) |
| **මුළු පොදුකාර්ය පිරිවැය** | **(3,705,391)** | **(3,413,378)** | **(2,918,884)** | **(2,293,370)** | **(2,066,136)** | **(1,688,783)** | **(1,623,660)** | **(1,869,352)** | **(1,580,309)** | **(1,706,759)** |
| මූල්‍ය ආදායම් | 6,943 | 6,891 | 6,875 | 7,436 | 5,765 | 5,721 | 5,086 | 4,896 | 4,357 | 3,959 |
| **බදු පෙර ලාභය** | **3,156,736** | **2,545,624** | **2,176,094** | **1,684,749** | **1,560,027** | **1,867,608** | **1,230,137** | **741,554** | **762,992** | **497,060** |
| ආදායම් බදු වියදම | 772,172 | 576,401 | 512,225 | 756,823 | 470,595 | 625,863 | 610,539 | 192,145 | 320,008 | 205,282 |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **2,384,564** | **1,969,224** | **1,663,869** | **927,926** | **1,089,432** | **1,241,744** | **619,598** | **549,409** | **442,984** | **291,778** |
| විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව | 57,438 | 191,755 | (1,926) | 30,453 | (59,575) | 10,049 | 239,887 | (212,044) | (31,574) | (14,281) |
| **එකතු විස්තීරණ ආදායම** | **2,442,002** | **2,160,979** | **1,661,943** | **958,380** | **1,029,856** | **1,251,794** | **859,485** | **337,365** | **411,410** | **277,497** |




**මූලික අනුපාත**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය -රා.ඖ.ස.(%) | 23.55 | 25.57 | 25.5 | 23.8 | 25.5 | 27.04 | 26.68 | 25.63 | 26.3 | 23.15 |
| දළ ලාභ අනුපාතය -ර.බෙ.ග.(%) | 6.41 | 6.29 | 6.33 | 6.76 | 7.27 | 7.08 | 7.23 | 7.72 | 7.05 | 7.18 |
| දළ අතිරික්තයට විකිණුම් (%) | 8.43 | 8.97 | 9.63 | 10.02 | 10.96 | 10.87 | 11.44 | 11.66 | 10.98 | 10.46 |
| වාර්ෂික විකුණුම් වර්ධනය-රා.ඖ.ස (%) | 7.37 | (1.42) | 19.66 | 13.12 | 7.60 | 15.90 | 8.67 | 12.61 | 0.9 | (10.88) |
| වාර්ෂික විකුණුම් වර්ධනය-ර.බෙ.ග. (%) | 30.35 | 26.45 | 36.65 | 21.05 | (0.60) | 36.25 | 11.05 | 2.6 | 1.2 | 32.1 |
| සමස්ථ විකුණුම් වර්ධනය (%) | 27.15 | 21.66 | 33.40 | 19.44 | 0.96 | 31.85 | 10.52 | 4.72 | 1.17 | 20.24 |

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**
**වසර දහයක සංඛ්‍යාත්මක තොරතුරු - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** රු. "000"

| විස්තරය | 2021<br>රු. | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. | 2015<br>රු. | 2014<br>රු. | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දායක ප්‍රාග්ධනය හා සංචිත** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** | **125,117** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| තොගය - රා.ඖ.ස | 2,396,406 | 2,751,098 | 2,802,020 | 2,754,287 | 1,798,403 | 2,009,502 | 2,364,091 | 1,385,477 | 1,703,222 | 1,231,857 |
| මාර්ගස්ථ තොගය - ර.බෙ.ග | 936,743 | 1,314,756 | 280,723 | 286,587 | 630,130 | 540,693 | 788,342 | 528,710 | 809,462 | 734,963 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 52,098,809 | 33,682,452 | 27,299,630 | 16,319,413 | 7,901,244 | 4,521,175 | 3,051,445 | 2,370,323 | 8,881,602 | 11,113,022 |
| තැන්පතු හා පෙර ගෙවීම් | 41,906 | 100,917 | 53,931 | 61,219 | 57,979 | 37,614 | 33,046 | 37,964 | 32,948 | 24,073 |
| අතැති මුදල් හා බැංකු මුදල් | 1,111,457 | 1,225,358 | 1,114,223 | 1,021,185 | 312,050 | 244,947 | 790,525 | 801,717 | 1,200,667 | 216,359 |
| **මුළු ජංගම වත්කම්** | **56,585,320** | **39,074,581** | **31,550,527** | **20,442,691** | **10,699,807** | **7,353,931** | **7,027,449** | **5,124,191** | **12,627,901** | **13,320,274** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 16,164,216 | 16,117,661 | 16,293,739 | 10,423,896 | 3,996,134 | 2,657,620 | 3,347,410 | 2,235,194 | 3,649,362 | 3,032,684 |
| ගෙවිය යුතු ආදායම් බදු | 576,607 | 475,496 | 352,117 | 438,060 | 337,976 | 519,770 | 397,758 | 180,617 | 290,045 | 191,440 |
| විලම්බිත ආදායම් | 1,471 | 1,800 | 1,461 | 1,345 | 927 | 1,103 | 1,005 | 748 | 889 | 1,292 |
| කල්බදු වගකීම් | 21,759 | 19,870 | 19,187 | | | | | | | |
| ජංගම මූල්‍ය වගකීම් | 15,432,057 | 55,929 | 6,310,716 | 2,639,033 | 1,361,444 | 39,703 | 56,689 | 78,739 | 6,254,353 | 7,896,709 |
| දිගුකාලීන ණය | 2,060,544 | 491,355 | | | | | | | | |
| **මුළු ජංගම වගකීම්** | **34,256,654** | **17,162,111** | **22,977,220** | **13,502,334** | **5,696,481** | **3,218,196** | **3,802,862** | **2,495,298** | **10,194,649** | **11,122,125** |
| ජංගම නොවන වත්කම් | 2,351,605 | 2,329,488 | 2,277,480 | 2,225,337 | 2,179,335 | 2,166,630 | 2,156,615 | 2,138,973 | 1,858,832 | 1,698,279 |
| ජංගම නොවන වගකීම් | 9,904,472 | 11,908,162 | 294,459 | 271,308 | 264,651 | 192,213 | 233,394 | 372,220 | 158,803 | 124,558 |
| **ශුද්ධ වත්කම්** | **14,775,798** | **12,333,796** | **10,556,328** | **8,894,386** | **6,918,010** | **6,110,152** | **5,147,807** | **4,395,646** | **4,133,281** | **3,771,870** |
| **මූලික අනුපාත** | | | | | | | | | | |
| වත්කම් පිරිවැටුම් අනුපාතය (වාර) | 1:34.3 | 1:27.1 | 1:22.78 | 1:17.48 | 1:14.94 | 1:14.89 | 1:11.34 | 1:10.35 | 1:11.37 | 1:12.3 |
| ජංගම අනුපාතය (වාර) | 1.65 | 2.28 | 1:1.37 | 1:1.51 | 1:1.88 | 1:2.29 | 1:1.85 | 1:2.05 | 1:1.24 | 1:1.2 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර) | 0.96 | 2.11 | 1:1.24 | 1:1.29 | 1:1.45 | 1:1.49 | 1:1.02 | 1:1.29 | 1:0.99 | 1:1.02 |
| පොලී ආවරණය (වාර) | 6.45 | 4.66 | 7.85 | 25.99 | 45.32 | 344.69 | 1676.94 | 5.95 | 552.29 | 2.71 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර)-රා.ඖ.ස | 2.75 | 2.36 | 2.39 | 2.5 | 2.58 | 2.04 | 2.07 | 2.34 | 2.17 | 2.97 |

# විකුණුම් ජාලය

**ප්‍රධාන කාර්යාලය**

**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව**

අංක 75 .සර් බාරොන් ජයතිලක මාවත ,
කොළඹ.1 ශ්‍රී ලංකාව.
දුරකතන: 011-2320356 – 9 ෆැක්ස්: 011-2447118 වෙබ අඩවිය: www.spc.lk විද්‍යුත් තැපැල්: spc@spc.lk

| | | | | |
|---|---|---|---|---|
| **විකුණුම් අංශය**<br>109, කඳවල වත්ත,<br>රත්මලාන.<br>දු.ක. 011-2632288<br>ෆැක්ස්: 011-2632962 | **ගබඩාව**<br>109, කඳවල වත්ත,<br>රත්මලාන.<br>දු.ක. 011-2634318<br>ෆැක්ස්: 011-2636715 | **ජීවනී අංශය**<br>109, කඳවල වත්ත,<br>රත්මලාන.<br>දු.ක. 011-2622334 | **මහනුවර ගබඩාව**<br>109, කඳවල වත්ත,<br>රත්මලාන.<br>දු.ක. 081-2240274 | අලෙවි හා විකුණුම් අංශය<br>"මෙහෙවර පියස" 26වන මහල,<br>අංක 41. කිරුලපාර, කොළඹ 5.<br>දු.ක. 011-2430778,<br>011-2328507,011-2320356-9 |

**RAJYA OSU SALA OUTLETS**

| | | | | |
|---|---|---|---|---|
| **ඔසුසල - අක්කරෙයිපත්තුව**<br>74,ටී.ඩී. 02, **කෙලින්විදිය,**<br>**අක්කරෙයිපත්තුව.**<br>**දු.ක.** 067-2057625 | **ඔසුසල-අම්පාර**<br>**පන්සල් හන්දිය,**<br>**ඩී.එස්. සේනානායක මාවත,**<br>**අම්පාර.**<br>දු.ක. 063-2223088 | **ඔසුසල-ආනමඩුව**<br>**බස්නැවතුම ඉදිරිපිට,**<br>**උස්වාව පාර,**<br>**ආනමඩුව**<br>**දු.ක.** 032-2263999 | **ඔසුසල - අනුරාධපුර**<br>**බැංකු වීදිය,**<br>**අනුරාධපුර.**<br>**දු.ක.** 025-2222181 | **ඔසුසල - අවිස්සාවේල්ල**<br>G 33/34/35,<br>**මධ්‍යම වෙළඳපොළ,**<br>**අවිස්සාවේල්ල.**<br>**දු.ක.** 036-2222501 |
| **ඔසුසල-බදුල්ල**<br>CWE **ගොඩනැගිල්ල,**<br>**බණ්ඩාරවෙල පාර,**<br>**බදුල්ල.**<br>**දු.ක**. 055-2229837 | **ඔසුසල-බදුල්ල** (II)<br>**බස්නැවතුම්පොළ**<br>**බදුල්ල.**<br>**දු.ක.** 055-2224700 | **ඔසුසල- බන්ඩාරගම**<br>රෝහල් පරිශ්‍රය,<br>හොරන පාර,<br>**බන්ඩාරගම.**<br>**දු.ක.** 038-2288671 | **ඔසුසල- බේරුවල**<br>MPCS ගොඩනැගිල්ල,<br>ගාලුපාර,<br>**බේරුවල.**<br>**දු.ක.** 034-2278578 | **ඔසුසල- බොරැල්ල**<br>ළමාරෝහල් පරිශ්‍රය,<br>**බොරැල්ල.**<br>**දු.ක.** 011-2697660 |
| **ඔසුසල-කොළඹ** 01<br>**75,** සර් බාරොන් ජයතිලක<br>මාවත , කොළඹ.1<br>**දු.ක.** 011-2328046 | **ඔසුසල-කොළඹ** 04<br>85, ගාලුපාර,<br>**කොළඹ** 04.<br>**දු.ක.** 011-2587128 | **ඔසුසල-කොළඹ** 07<br>255, ධර්මපාල මාවත,<br>**කොළඹ** 07.<br>**දු.ක.** 011-2694716<br>011-2672293 | **ඔසුසල- දඹුල්ල**<br>46/A, කුරුණෑගල හංදිය,<br>**දඹුල්ල.**<br>දු.ක. 066-2285133 | **ඔසුසල- දියතලාව**<br>**කෙලින් වීදිය,**<br>**දියතලාව.**<br>දු.ක. 055-3551624 |
| **ඔසුසල-ඇඹිලිපිටිය**<br>102, පල්ලෙගම,<br>**ඇඹිලිපිටිය.**<br>**දු.ක.** 047-2261177 | **ඔසුසල- කොටුව**<br>කොටුව දුම්රිය ස්ථානය,<br>**කොටුව.**<br>**දු.ක.** 011-2336926 | **ඔසුසල- ගාල්ල**<br>61A වක්වැල්ල පාර,<br>**ගාල්ල.**<br>**දු.ක.** 091-2234726 | **ඔසුසල- ගම්පහ**<br>266, කොළඹ පාර,<br>**ගම්පහ.**<br>**දු.ක.** 033-2234516 | **ඔසුසල- හම්බන්තොට**<br>අංක 3 බැරැක්ක වීදිය,<br>**හම්බන්තොට.**<br>**දු.ක.** 047-2222163 |
| ඔසුසල- හොරණ<br>කඩ අංක 1, 2වන අදියර,<br>මධ්‍යම බස් නැවතුම්පල,<br>හොරණ..<br>**දු.ක.** 034-2205333 | **ඔසුසල- ජයවර්ධනපුර**<br>**ශ්‍රී ජයවර්ධනපුර** රෝහල,<br>**ශ්‍රී ජයවර්ධනපුර.**<br>**දු.ක.** 011-2779414 | **ඔසුසල- යාපනය**<br>149A, **කේ.කේ.එස්. පාර,**<br>**යාපනය.**<br>**දු.ක.** 021-2219262 | **ඔසුසල- මහනුවර**<br>14A ළමාගාර මාවත,<br>මහනුවර.<br>**දු.ක.** 081-2225175 | **ඔසුසල- මහනුවර දුම්රිය ස්ථානය**<br>**මහනුවර දුම්රියපොළ,**<br>මහනුවර.<br>**දු.ක.** 081-2225176 |
| **ඔසුසල- කරාපිටිය**<br>175, හිරිඹුර පාර,<br>කරාපිටිය.<br>**දු.ක.** 091-2226947 | **ඔසුසල-**<br>ජොන් කොතලාවල<br>ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>රෝහල් පරිශ්‍රය,<br>වේරහැර.<br>**දු.**ක. 011-2044595 | **ඔසුසල-** කුරුණෑගල<br>28.වීරතුංග ගොඩනැගිල්ල,<br>බෞද්ධාලෝක මාවත,<br>කුරුණෑගල<br>දු.ක. 037-2230840 | ඔසුසල - මැදවච්චිය<br>අංක 50, නුවර පාර,<br>මැදවච්චිය.<br>දු.ක. 025-2121040 | **ඔසුසල-** මහරගම<br>71/9,අල්විස් ගොඩනැගිල්ල<br>පරණ පාර,<br>මහරගම.<br>දු.ක. 011-2745640 |
| **ඔසුසල-** මාතලේ<br>අංක. 110,<br>ධර්මපාල මාවත,<br>මාතලේ.<br>දු.ක. 066-2220126 | **ඔසුසල-** මාතර<br>23B වාරිකාරාමය,<br>අනගාරික ධර්මපාල මාවත,<br>මාතර.<br>**දු.ක.** 041-2231871 | **ඔසුසල-** මතුගම<br>අංක්. 126, කළුතර පාර,<br>මතුගම.<br>දු.ක. 034-2248861 | **ඔසුසල-** මිනුවන්ගොඩ<br>24. පරණ නගරසභා<br>ගොඩනැගිල්ල,<br>කොළඹ් පාර, මිනුවන්ගොඩ.<br>දු.ක. 011-2295120 | **ඔසුසල-** මොනරාගල<br>31, පොතුවිල් පාර,<br>මොනරාගල.<br>දු.ක. 055-2277712 |
| **ඔසුසල-** නාගොඩ<br>313,මතුගම පාර,<br>නාගොඩ,<br>කළුතර.<br>දු.ක. 034-2222818 | **ඔසුසල- නාරාහෙන්පිට**<br>අංක.44 ආර්ථික<br>මධ්‍යස්ථානය,<br>නාරාහෙන්පිට.<br>දු.ක. 011-2055284 | ඔසුසල- මීගමුව<br>134,කොළඹ පාර,<br>මීගමුව.<br>දු.ක. 031-2228599 | **ඔසුසල-** නින්දවූර්<br>අංක 40. කෙලින් වීදිය,<br>නින්දවූර්<br>දු.ක. 067-2058208 | **ඔසුසල-** නුගේගොඩ<br>145A/1, එස්. ද. එස්. ජයසිංහ<br>මාවත,<br>නුගේගොඩ.<br>දු.ක. 011-2856641 |
| **ඔසුසල-** පානදුර<br>159, M.P.C.S<br>ගොඩනැගිල්ල,<br>ගාලුපාර,<br>පානදුර. දු.ක. 038-2234767 | **ඔසුසල-** පේරාදෙණිය<br>1157, ගැටඹේ,<br>පේරාදෙණිය<br>දු.ක. 081-2386045 | **ඔසුසල- පිළියන්දල**<br>1A/21, විද්‍යාල මාවත,<br>**පිළියන්දල**.<br>දු.ක. 011- 2613640 | ඔසුසල- පිටකෝට්ටේ<br>326,කෝට්ටේ පාර,<br>පිටකෝට්ටේ<br>දු.ක.011-2099444 | **ඔසුසල-** පොළොන්නරුව<br>රෝහල හංදිය,<br>කදුරුවෙල පාර, පොළොන්නරුව.<br>දු.ක. 027-2225465 |
| **ඔසුසල-** රාගම<br>අංක.61A,<br>මහබාගේ පාර,<br>රාගම.<br>දු.ක. 011-2955219 | **ඔසුසල-** රත්මලාන<br>මෙගා ස.තො.ස.<br>ගොළුමඩම හංදිය, ගාලුපාර,<br>රත්මලාන.<br>දු.ක. 011-3043789 | **ඔසුසල-** රත්නපුර<br>32 නන්ද එල්ලාවල මාවත,<br>රත්නපුර.<br>දු.ක. 045-2223014 | **ඔසුසල- තංගල්ල**<br>අංක 8,ඉදිපොකුණුගොඩ<br>පාර, තංගල්ල.<br>දු.ක. 047-2241221 | |

**State Pharmaceuticals Corporation of Sri Lanka**
75, Sir Baron Jayatillake Mawatha, Colombo 01, Sri Lanka